# 'පට්ඨාන' විසිතුන්වෙනි දේශනාව (කර්ම ප්‍රත්‍යය)

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට සියලුම කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ සියලුම ක්ලේශ ධර්මයන් නැසුවාවූ සංසාරයට බැඳී පවතින්නාවූ සංසාරයේ අර කෙලෙස් අර සහමුලින්ම නැතිකොට පිරිසිදු උනාවූ සියලුම දෙව් මිනුසුන්ගේ ආමිස පූජාවන් වන්දනාමානයන්ට ඒකාන්තයෙන්ම සුදුසු උනාවූ රහසින්වත් කිසිම පාපයක් නොකරන්නාවූ අරහං ගුණයෙන් සමන්නාගත වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට මහා කරුණාවකින් දයාවකින් හේතු ඵල ධර්ම රාමුවේ කොටු වී ඉන්නාවූ සත්වයන්ට පරම ගාම්භීර වූ හේතුඵල ධර්මයන් අවබෝධ කරවල ඒ හේතුඵල ධර්මයන්ගෙන් මිදිලා නිර්වාණ ධාතුව කියන ශාන්ත ධර්මයට එකතුවෙන්ට මාර්ගය පෙන්වා වදාළා වූ ඒ උතුම් නිවනින් සැනසීම සිද්ධ කර ගත්තාවූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සන්තානයේ පහළ වී වදාළා වූ ඒවාගේම අවබෝධ කොට ගත්තාවූ ලෝකයට දේශනා කල වදාළා වූ පරම ගාම්භීර වූ ශ්‍රී සත්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

අශ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට ලොවතුරා බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවක භූමියේ පිහිටියා වූ ලොවට පුණ්‍යක්ෂේත්‍රයක් වූ  මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ ගුණ ආනුභාව බලයෙනුත් මේ මොහොතේ තුනුරුවන්ගේ ගුණ සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් මේ පින්වත් සැමදෙනාම සිදු කරගත්තාවූ දාන සීල භාවනා ආදී පින්කම් වල ඒ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් මේ පින්වත් සැමදෙනාටම අද මේ දහම් වැඩ සටහන තුලින් අපි ඉදිරි පත් කොට කියල දෙන්ට බලාපොරොත්තුවෙන ගාම්භීර ධර්ම කාණ්ඩය ඉතාමත්ම හොඳින් තේරුම් ගන්ට වටහා ගන්ට හැකිවේවා! ඒ සඳහා නුවණ පහළ වේවා! සැමදෙනාටම එක එක වචනයක් පාසා එක එක ධර්ම කාරණයක් කාරණයක් පාසා හිත මෙහෙයවන්ට සිහිය නුවණ පහළ වේවා! යෝනිසෝ මනසිකාරය ඇතිවේවා! හොඳින් මේ ධර්ම කරුණු අවබෝධ කරගෙන වටහාගෙන සැමදෙනාටම නිවනින් සැනසෙන්ට ලැබේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

අද මම මේ දහම් කථාවෙන් මේ පින්වතුන්ට කියල දෙන්ට බලපොරොත්තු වෙන්නේ  අපි මීට කලින් මම හිතන්නේ යම් වෙලාවක කෙටියෙන් හරි කියා ස්පර්ශ කලාවූ අපේ සිහියෙන් නුවණින් අපි පොඩ්ඩක් සලකා බැලුවාවූ ප්‍රත්‍යය ධර්මයක් පිළිබඳව. මේ ප්‍රත්‍යය කථාවේ

ප්‍රත්‍යය ධර්ම 24 ක් ගැන කියවෙනවා. ඒ ප්‍රත්‍යය ධර්ම 24 න් අදට 13 වෙනි ප්‍රත්‍යය ධර්මය වෙන **'කර්ම ප්‍රත්‍යය'** පිළිබඳව තරමක් දුරට කියල දෙන්න බලා පොරොත්තු වෙනවා. අද කථා කරන්නේ 'කර්ම ප්‍රත්‍යය' පිළිබඳවයි. මේ 'කර්ම ප්‍රත්‍යය' විශේෂයෙන්ම අපි පැහැදිලිව පිරිසිඳුව හොඳට අවබෝධ කරගත යුතුයි. සූත්‍ර දේශනාවල් වල කර්මය පිළිබඳව එක්තරා විදියකට දේශනා කරලා තිබෙනවා - විස්තර කරලා තිබෙනවා. ඒ දේශනාව ඒ විස්තරය සූත්‍රවල එන්නේ ක්‍රියාවන් සම්බන්ධයෙන්. ඒ කියන්නේ කරන ක්‍රියාව සම්බන්ධයෙන් සහ ක්‍රියාවක් කරල ඒකෙ විපාකය විඳින අවස්ථාව සම්බන්ධව තමයි ගොඩක්ම ඒ කර්ම විග්‍රහය තිබෙන්නේ. ලෝකයේ තිබෙන්නාවූ සිදුවීම් අලලා ඒ ලෝකයේ සිදුවීම් දිහා බලල ඒවා තුලින් කර්මය පෙන්වීමක් තමයි ඒ සූත්‍ර දේශනා වල තිබෙන්නේ. මේ දහම් කාණ්ඩයේ මෙතැන කියවෙන්නාවූ කර්ම විග්‍රහය ඊට වඩා සූක්ෂම ආකාරයෙන් විස්තරාත්මකව නිරවශේෂ දේශනාවක් හැටියට ඉදිරිපත් කරලා තියෙනවා.

අපි මේක තේරුම් ගන්ට කලින් මේ හිත පිළිබඳව කල්පනා කරමු. මේ හැම වෙලාවකම යම්කිසි ආරම්මණයක් ගනිමින් - යම්කිසි දෙයක් අරමුණු කරමින් අපි හැම එක්කෙනාටම සිතක් පහළ වෙනවා. හැම මොහොතේම සිතක් පහළ වෙනවා. භවාංග සිත් ඇරෙන කොට අනිත් සෑම හිතකම යම්කිසි මහා විසාල ක්‍රියා ගුණ බලයක් තිබෙනවා. භවාංග සිතෙත් තිබෙන බව හැබෑව. එතකොට මේ සෑම සිතක්ම මොකක් හරි ක්‍රියාවක් සිද්ධ කරනවා. අපි ඉගෙන ගන්නවා හේතු ඵල ධර්ම එහෙම නැත්නම් ප්‍රත්‍යය ධර්ම කථාව තුලින් ඉගෙන ගන්නවා සිත් පිළිබඳව චෛතසික ධර්ම පිළිබඳව රූප පිළිබඳව නිර්වාණ ධාතුව ධර්මය පිළිබඳව. මෙතන මේ චිත්ත චෛතසික තමයි අපිට හිත හැටියට පහළ වෙන්නේ. හිතක් පහළ වෙන අවස්ථාවේදී චෛතසික රාශියක් - චෛතසික ගොන්නක් එක්ක තමයි ඒ හිත මතුවෙන්නේ හිත ඇතිවෙන්නේ. අපි මීට කලින් ඉගෙන ගෙන දැන ගෙන තිබෙනවා - චෛතසික ධර්මවල තිබෙනවා සර්ව චිත්ත සාධාරණ ඒවාගේම ප්‍රකීර්ණක අකුසල කුසල චෛතසික ධර්ම තිබෙනවා ඔය ඔක්කොම වර්ග කරලා ගත්තම 52ක්. අපේ හිතේ එක චෛතසික ධර්මයක් තිබෙනවා මහා පුදුම හැකියාවක් තිබෙන පුදුම බලයක් තිබෙන පුදුම වේග සවභාවක් තිබෙන අමුතුම බල විශේෂයක් තිබෙන චෛතසිකයක් තිබෙනවා. ඒ චෛතසික නම් කරනවා 'චේතනා' චෛතසික කියල. තවත් මේ පින්වතුන් අහල තිබෙනවා චෛතසික ධර්ම තිබෙනවා 'වේදනාව' කියල චෛතසිකක් තිබෙනවා - ඒ වේදනා චෛතසිකයට විඳින්න පුළුවන්. අරමුණු රසය විඳන්න පුළුවන්. 'ස්පර්ශ' චෛතසිකයක් තිබෙනවා ඒ ස්පර්ශ චෛතසිකයට - 'සිත' 'චෛතසික ටික' අරමුණත් එක්ක ගොනු කරලා දෙන්න පුළුවන්. 'මනසිකාරය' තිබෙනවා. මනසිකාරයට අරමුණ මෙනෙහි කරන්ට පුළුවන්. එක එක හැකියාවල් තිබෙන එක එක ගුණ විශේෂ ශක්ති විශේෂ තිබෙන ධර්ම ගොන්නක් තිබෙනවා. ඔය ධර්ම ගොන්නේ අමුතුම බලයක් තිබෙන අමුතුම ගතියක් තිබෙන චෛතසිකයක් තමයි 'චේතනා' චෛතසිකය කියල කියන්නේ. ඒ චේතනාව හරියට ගෙදර ප්‍රධානියා වගෙයි. ආයතනයක හරියට manager කෙනෙක් වගෙයි. Manager කෙනෙක් වගේ වැඩ කරන යම්කිසි ශක්ති විශේෂයක් - හොඳට හිතල බලන්න ඇයි මේ වචනය පාවිච්චි කරේ කියල. Manager කියන එක්කෙනාගේ ස්වභාවය හිතන්න. Manager කියන එක්කෙනා එයා ආයතනයේ කටයුතු පරිපාලනය කරනවා manager කරනවා. එයාගේ යටතේ තමයි ඒවා කෙරෙන්ට ඕනෑ වෙන්නේ. සේවකයෝ කොච්චර හිටියත් ඒ සේවකයෝ වැඩ වල මෙහෙයවන එක්කෙනා manager. ක්‍රියා වලට යොමු කරන එක්කෙනා manager.

එතකොට අපිට බැලූ බැල්මට පේනවා යම්කිසි ආයතනයක manager කියන කෙනා අනිත් අය මෙහෙයවනවා. අපි හිතමු ඇඳුම් කර්මාන්ත ශාලාවක manager ඇඳුම් කපන්න කට්ටියක් යොමු කරනවා. ඇඳුම් මහන්න තව කට්ටියක් යොමු කරනවා. ඊළඟට ඇඳුම් නවන්න තව කට්ටියක් යොමු කරනවා. පැකට් කරන්න තව කට්ටියක් යොමු කරනවා ඔය විධියට ඒ එක එක අංශ වලට මෙයා යොමුකරලා කොටස් කරලා පාලනය කරන ගතිය මෙහෙයවන ගතිය ඒ manager ට තියෙනවා. එතකොට මෙයාගේ යටතේ තමයි අනිත් අය එයා කියන විදියට තමයි කරන්නේ. බැලූ බැල්මට පේනවා මෙයා මොකක්වත් කරන්නේ නෑ කියල. අනිත් අයට වැඩ කියනවා - අනිත් අය වැඩ වල යොදවනවා අනිත් අය වැඩ වල මෙහෙයවනවා මෙයා නිකන් ඉන්න හැටියක් වගේ තමයි පෙන්නේ. එහෙම හිතුවට ඒක වරදක්. එයා ඒ මෙහෙයවන වැඩේ කරනවා. ඒක නිසා ඒකත් වැඩක්. එයා අනිත් අය මෙහෙයවනවා - අනිත් අයගේ කටයුතු හොයල බලනවා - මෙහෙයවන වැඩේ එයා කරනවා. ඒක තමයි ප්‍රධාන. ඒක නිසා එයාගේ තුල තිබෙනවා - manager ගේ තිබෙනවා අමුතු හැකියාවක් - අමුතු බලයක් අනිත් අය මෙහෙයවන්න පුළුවන්. ඒ මෙහෙයවන වැඩේ එයාට පුළුවන් එයා දන්නවා මෙයා මෙතෙන්ට මෙයා මෙතෙන්ට කියල. ඒ හැකියාව ඒ බලය ඒ ගුණය ඒ වේගය manager ගාව තියෙනවා. එතකොට එයා තමයි වැඩ කරපු අයගේ ඒ ශක්තිය දන්නේ ඒවගේම වැඩ කරපු අයට යොදන්ට දෙන්ට කියන්න තියෙන ඒවා දන්නේ ඒගොල්ලන්ගෙන් ගත්ත සේවාව දන්නේ එයා. ආන්න ඒ වගේ අපේ මේ හිත්වල පහළ වෙන්නාවූ යම්කිසි ධර්ම විශේෂයක් තිබෙනවා ඒ ධර්ම විශේෂය මහ අමුතු බලයක්. කවදාකවත්ම හිතක් පහළ වෙන්නේ නෑ තනියෙන්. තනියෙන් හිතක් පහළ වෙන්නේ නෑ. චෛතසික රාමුවක් චෛතසික ගොන්නක් අනිවාර්යෙන්ම තියෙන්ට ඕනෑ පිහිටන්න ඕනෑ. එතකොට සිත එකක්. චෛතසික ධර්ම තව ඒවා. මේ හිතයි චෛතසික ධර්මටිකයි මෙහයවන -ක්‍රියාවකට යොදවන - ක්‍රියාවකට බස්සවන - ක්‍රියාවක හසුරුවන්නාවූ ගුණයක් ගතියක් බලයක් මේ 'චේතනාවට' තියෙනවා. අනිත් ඒවා මෙහෙයවන ගතියක් - ක්‍රියාවක් කරවන ගතියක් තිබෙනවා. ඒ ක්‍රියාව කරන ගතිය තමයි 'චේතනා ගුණය' කියල කියන්නේ. දැන් එහෙම නැත්නම් එහෙම මේක හසුරුවන්ට බෑ. චිත්ත චෛතසිකරාශිය කියල කියන්නේ ඒක නාම ධර්ම මණ්ඩලයක්. එතකොට හිතක් පහළ වෙන්නේ - හොඳට බලන්න - හිතක් පහළ වෙනකොට - හිතක් පහළ වෙන්නේ අරමුණකට හැරිලා - අරමුණක් දැනගනිමින් - අරමුණක් අරමුණු කරමින් - අරමුණක් දැනගනිමින් - අරමුණට නැමිලා තමයි හිත පහළ වෙන්නේ. ඒ හිත පහළ වෙනකොට හිතට උදව් උපකාර කරන්ට තව චෛතසික ධර්ම ඔය **ස්පර්ශය වේදනාව සංඥාව චේතනාව ඒකාග්‍රතාවය ජීවිතේන්ද්‍රිය මනසිකාරය විතක්ක විචාර අධිමොක්ඛ විරිය ප්‍රීති ඡන්ද ශ්‍රද්ධා සති හිරි ඔත්තප්ප** වගේ ඔය වගේ කුසල් පැත්තට නම් ඒ අවශ්‍ය කරන ටිකක් පහළ වෙනවා. එතකොට ඔය අතර ඔය එන එක රංචුවට මතුවෙන ඒ නාම ධර්ම සමුදාය- ඒ නාම ධර්ම සමුදායේ නියම ක්‍රියාව කරවන්ට - ඒ ඒ අදාල දේවල් කරවන්ට - මෙහෙයවන්නාවූ ඒ ශක්තිය තියෙන ධර්මය උපදිනවා - ඒ තමයි **'චේතනා'** චෛතසික. මේ චේතනාවට තමයි **'කර්මය'** කියල කියන්නේ.

දැන් සූත්‍ර දේශනා වල ඕක කියන්නේ ද්වාර වශයෙන් කථා කරනවා. සූත්‍ර දේශනා වල මේක ද්වාර වශයෙන් - ඒ කියන්නේ කාය කර්ම ( එතකොට කාය කර්ම - ක්‍රියාවක් තිබෙනවා - කයේ ක්‍රියාව). වාචසික කර්ම (වාග් කර්ම - වචනයේ ක්‍රියාව). මනෝ කර්ම (මනසේ ක්‍රියාව). දැන් මෙතන තියෙනවා කාය කර්ම කියල එකක්. කාය කර්මය කියල කියන කොට

ක්‍රියාව සිද්ධ වෙන්නේ කයින් කියල බාහිරයට පේනවා. අත ඔසවනවා - පහත් කරනවා - හිට ගන්නවා - ඉඳ ගන්නවා - ගමන් කරනවා. ඒවගේම යමක් දෙනවා - ගන්නවා - මේ වගේ කයින් ගොඩක් ක්‍රියාවල් සිද්ධ වෙනවා. එතකොට මේ කයට - හිට ගන්න පුළුවන් ගතියක් ගැම්මක් නෑ. කයට එහෙම යන්න පුළුවන් ගතියක් ගැම්මක් හයියක් නෑ. ඉඳගන්ට හිටගන්ට යන්ට දුවන්ට මොකක්වත් කරන්ට හයියක් ගැම්මක් හුදකලාවූ ශක්ති ස්වභාවයක් කයට නෑ. කය නිකම්ම බැලුවයින් පස්සේ ඔය පිටි ගෝනිය වගේ තියෙන එකක් මේ තිබෙන්නාවූ කය. දැන් කියනවා කාය කර්ම කියල - මේ හිරවෙලා නැවතිලා තිබෙන කය ඇවිද්දවන්ට - ඉඳ ගන්ට දුවවන්ට පන්නවන්ට - මේවා කරවන්ට අර හිත මෙහෙයවෙන්ට ඕන. හිතේ තිබෙන ගතියක් ඕකට ගහන්න ඕන. එතකොට ඇත්ත වශයෙන්ම කාය කර්ම - කායික ක්‍රියාව කියල කිව්වාට ඒ කය මෙහෙය වන්නාවූ මූල ධර්මය තියෙන්නේ හිතේ. ඒ තමයි **'චේතනාව'**.

අපි දැන්මේ වචන කථා කරනවා. වචන ගොඩක් කථා කරනවා. මේ වචන - මේ සද්ද මේ විදියට ගානට පිට කරන්ට - හසුරුවන්ට වචන තෝරන්ට - වචන හිත්වන්ට - වචන පෙළ ගස්සන්ට - ධර්ම කාරණය හිතන්ට ආදී මේ ක්‍රියා ඔක්කෝම - මේ වචන ටික පේලි ගස්ස ගස්සා වාක්‍ය ගතකර කර ශබ්ද අඩු වැඩි කර කර - නවත්වන තැන වල නවත්වා නවත්වා - පටන් ගන්න තැන්වල පටන් ගනිමින් මේ වාචසික මේ ශබ්ද ක්‍රියාව මෙහයවන මධ්‍යස්ථානය තමයි **'හිත'**. ඒ මධ්‍යස්ථානයේ ප්‍රධානියා **'චේතනාවයි'**. ඒක නිසා චේතනාව කියන එක පෙන්නේ නෑ. ඒ චේතනාව කියන එක හිතට සම්බන්ධ නාම ධර්මයක්. හැබැයි චේතනාව මෙහෙය වීමෙන් ඇතින්නාවූ වාචසික ක්‍රියාව අනිත් කෙනෙකුට දැනෙනවා. චේතනාව මෙහෙයවපු කායික ක්‍රියාව තවත් කෙනෙකුට දැනෙනවා. ඒවගේම තමයි සිතවනවා - මානසික වශයෙන් මේ චේතනාව ඔය එක එක දේවල් හිතවනවා. එතකොට මේ කර්ම - ද්වාරික වශයෙන් තමයි මේ කථා කරන්නේ. 'කාය කර්ම' 'කාය ද්වාරය' – 'වාක් කර්ම' 'වාග් දවාරය' – 'මනෝ කර්ම' 'හිතෙන' 'හිත හිත ඉඳීම'. ඔය විදයට කර්මය ගැන කථා කරන මූල මධ්‍යස්ථානය තමයි **'චේතනාව'**.

තවත් විදියකට කර්මය කියනව. දැන් බාහිර බශයෙන් අරමුණකට සම්බන්ධ කරලත් කර්මය ගැන කථා කරනවා. ඔය විදියට තමයි සූත්‍රයේ තියෙන්නේ. දැන් බලන්න 'අදින්නාදානා' කර්මය - කර්මයක්නේ - අදින්නාදානා කර්මය කියල කියන්නේ නුදුන්නාවූ දෙයක් ගන්නවා. ඒක ක්‍රියාවක්. තමන්ට නුදුන්නාවූ මේ පංච උපාදානස්කන්ධයට අයිතියක් නැති වෙනත් පංච උපාදානස්කන්ධයකට අයිති කම් කියන්නාවූ රූපමය යම්කිසි වස්තුවක් - ද්‍රව්‍යයක් - දෙයක් - තමා වෙතට ගන්නවා. එතකොට ඒ ගැනීමේ ක්‍රියාව අදින්නාදානය කියල අපි නම් කරනවා. හැබැයි අදින්නාදාන ක්‍රියාව සිද්ධ වෙන මූල මධ්‍යස්ථානය හෙවත් ප්‍රධාන කාරණය 'චේතනාව' 'මෙහෙයවීම'. ඔය විධියට අමුතුම අමුතු ගුණ විශේෂයක් - ධර්ම විශේෂයක් තියෙනවා මේ චේතනාවට. ඇත්ත වශයෙන්ම බැලුවොත් එහෙම ඔය චෛතසික ධර්ම 52 තුල මේ චේතනාවට තිබෙන්නාවූ හයිය හත්තිය වෙන කිසිම එහෙකට නෑ. වෙන කිසිම චෛතසිකට මේ තරම් හයියක් ගැම්මක් ශක්තියක් නෑ. බොහෝම බලවත් ඒ වගේම පිරිසිඳු - අනිත් අය මෙහෙයවාගෙන තමනුත් කටයුතු කරන්නාවූ ගතියක් මේකේ තියෙනවා. ඒක නිසා මේකට කියනවා 'කර්මය' කියල. මොකක්ද 'කර්මය' කියල කියන්නේ? මේ 'චේතනාව'. මේ චේතනාව නැති හිතක් නැනේ. චේතනාව නැති එක හිතක්වත් හොයාගන්ට නෑ.

අපි මේ ප්‍රත්‍යය කථාවේ කතා කරනවා සිත් 89 පිළිබඳව. මේ සිත් 89 යේම තියනවා 'චේතනාව' කියන ශක්තිය. 'චේතනාව' කියන මෙහයවන ගුණය තියෙනවා. මේ 'චේතනාව' අමුතු අමුතු වැඩ කරන එකක්. දැන් මම කිව්වා සිත් 89 ම චේතනාව තියෙනවයි කියල. එතකොට චේතනාවට කර්මය කියල කියනවයි කියලත් කිව්වා. එතකොට චේතනාවට කර්මය කියලා කියනවානම් සිත් 89 යේම චේතනාව පහළ වෙනවානම් ඇතිවෙනවා නම් හැම චේතනාවකම කර්මයක් තියෙනවා නේද කියන කාරණය හොඳට ඉදිරිපත් වෙනවා - හොඳට පැහැදිලි වෙනවා. එහෙම උනහම පව් කරන්නාවූ - පව් සිතුවිලි වලත් එහෙම නැත්නම් අකුසල කර්ම සිත් 12 ත් තියෙනවා. කුසල සිත් 24 රෙත් තිබෙනවා. රූපාවචර අරූපාවචර ආදී ඒවගෙත් තියෙනවා. ඊළඟට ලෝකෝත්තර සිත් 8 තිබෙනවා චේතනාව. එතකොට බැලුවයින් පස්සේ මේ හැම කුසල්වල- අකුසල් වල - අහේතුකවල - රූප - අරූප - ලෝකෝත්තර යන හැම සිතකම චේතනාව තිබෙනවානම් මේ හැම සිතකම කර්ම රැස් වෙනවා නේද කියන අදහසක් -සිතුවිල්ලක් අපිට මේක අහන කොට හිතෙනවා - ගොනුවෙනවා - හිතට ඇතිවෙනවා. ඒ කර්ම රැස්වීමේ කථාව කෙසේ වෙතත් අපි තේරුම් ගන්ට ඕනෑ මේ විදියට චේතනාවම ඔය හැම තැනම තියෙනවා කියල.

මේ චේතනාවේ තිබෙනවා වැඩ කරන ආකාර දෙකක්. ක්‍රියාත්මක වෙන හැඩ විධි දෙකක් තියෙනවා. ඒ තමයි **'සහජාත චේතනාව' 'නා නා ක්ෂණික චේතනාව'** කියල චේතනාව ආකාර දෙහෙකට වැඩ කරනවා. මොකක්ද? – 'සහජාත චේතනාව' සහ 'නා නා ක්ෂණික චේතනාව'. සමහර සිත් වල චේතනාව තිබුනාට ඒකෙ ඒ වෙලාවට ක්‍රියාවක් කරනවා. හැබැයි අනාගතයට කර්ම රැස්කරන්නේ නෑ. හොඳට තේරුම් ගන්න සමහර සිත්වල චේතනාව පහළ වෙනවා හැබැයි ඒ වෙලාවට ක්‍රියාවක් කරනවා. කයින් හරි - කය මෙහෙයවල හරි - වචනය මෙහෙයවල හරි - මනසේ හරි - කොහොම හරි මෙහෙයවල ක්‍රියාවක් කරනවා. හැබැයි ඒ ක්‍රියාව **'ක්‍රියා මාත්‍රයක්'** පමණයි. අනාගතයට ඒකෙ අමුතු දෙයක් ගලපන - එවගේම ඇති කරන - මතු කරන හයියක් බලයක් නෑ.

සමහර සිත්වල තිබෙනවා මේ වෙලාවේ හිතක් හිතන කොට චේතනාවක් එහෙම නැත්නම් හිතක් පහළ වෙනවා චේතනාවක් එක්ක. හැබැයි ඒ සිත ඇතිවෙලා නැතිවෙලා යනවා චේතනාවත් එක්ක. හැබැයි එහෙම නැතිවෙලා ගියාට ඒක නිකම්ම නිකං යන්තම් වෙන නැතිවීමක් නෙමෙයි. ඒක යම්කිසි ඌෂ්ණයක් -ඒකෙ යම්කිසි ස්වභාවයක් - ඒවාගේම තවත් අනාගතයට මොකක් හෝ දෙයක් උපදවල - රැස් කරලා - මතු කරලා - උලුප්පවලා දෙන ගතියක් - එක්කාසු කරල ඒ ශක්තිය ඉතිරි කරල තමයි නැතිවෙලා යන්නේ. එහෙම උනායින් පස්සේ - පස්සේ කාලයකදී ඕක කොතැන හරි තැනක විපාකයක් හැටියට ඉස්මතුවෙනවා - පැතිරෙනවා - හටගන්නවා. අන්න ඒ වාගේ 'චේතනා' වලට කියනවා 'නා නා ක්ෂණික චේතනා ස්වභාවය' කියල. මේ කථාව ටිකක් හරිම පරෙස්සමෙන් දැනගත යුතු - ඇසිය යුතු - හිතිය යුතු - මෙනෙහි කරයුතු දෙයක්. එහෙම නැති උනොත් එහෙම මේක ටිකක් තේරුම් ගන්ට අපහසුවෙනවා.

අපේ පින්වතුන් හොඳට තේරුම් ගන්ට - අපි හැම එක්කෙනාටම දැන් හිතක් පහළ වෙනවා. ඒ හැම එක්කෙනාගේම හිත්වල චේතනාව පහළ වෙනවා. දැන් අපි මේ කරන වැඩේ දිහා බලන්න - හිතන්ට. දැන් මේ අපිට නොපෙනෙන - ශබ්ද වලින් පමණක් - කට හඬ වලින් පමණක් සම්බන්ධ වෙලා දැන් මේ පින්වතුන් බණ ඇසීමේ ක්‍රියාවක් යයි කියල කරනවනේ. දැන් මේ බණ අහමින් ඉන්නවා. දැන් අපි බණ දේශනා කරනවා - මේ පින්වතුන් අහනවා. දැන් මේ බණ අහනවා කියල කියන තැන මෙතන ක්‍රියාවක් සිද්ධ වෙනවා. මේ ක්‍රියාව සිද්ධ වෙන්නේ කන එහෙම නැත්නම් සෝතද්වාරය හරහා. සෝතද්වාරය හරහා මේ බණ ඇසීමේ ක්‍රියාව සිද්ධ වෙනවා. ඒවාගේම බණ හිතීමේ ක්‍රියාවකුත් සිද්ධ වෙනවා. අහන අහන කොටස සිතනවා මෙනෙහි කරනවා. අහන අහන කැල්ල හිතනවා මෙනෙහි කරනවා. එතකොට මනසෙනුත් මේ බණඇසීමේ ක්‍රියාව සිතීම් වශයෙන් සිද්ධ වෙනවා. කනෙනුත් මේක බණ ඇසීම් වශයෙන් ද්වාර වශයෙන් සිද්ධ වෙනවා. මේ හැම වචනයක් වචනයක් ගානෙම - හැම සිතුවිල්ලක් ගානෙම හැම කෙනාගේම හිත් වල චේතනාවක් පහළ වෙනවා. චේතනා නැතුව මේ වෙලාවේ එක හිතක්වත් පහළ වෙන්නේ නෑ. දැන් මේ හැම හිතකම පහළ වෙනවා චේතනාව. හැබැයි චේතනාව පහළ වෙන්නේ හිතයි අනිත් චෛතසික ධර්‍ම රාශියකුත් එක්කාසු වෙලා. හිතයි අනිත් චෛතසික රාශියකුයි එක්කාසු කරගෙන පහළ වෙනවා චේතනාව. එතකොට මේ හැම එකෙනාගේම සිත්වල පහළ වෙන ඒ හිතයි අනිත් චෛතසික ධර්‍මයි එක්කනේ මේ චේතනාව පහළ වෙන්නේ. එතකොට නිකන් සමගි සම්පන්න සාමූහික හැඟීමකින් සහජාතව තමයි මේක පහළ වෙන්නේ. ඔන්න ඔය විදියට මේ වෙලාවේ මේ සහජාතව පහළ වෙන ඒ චෛතසික ධර්‍ම - **'සහජාත චේතනා' 'සහජාත කර්ම'**. සහජාත චේතනාව කියල කියන්නේ - එකට උපදින. එතකොට මේ එකට උපදිනවා වගේම ඒ චේතනාව මහා බලවත් වැඩක් කරවනවා. ඒ තමයි මේ පැත්තට - මේ කියන වචනයට හිත හරවල - මේ වචනය පැත්තට හිත යොමුකරවල ඒවාගේම ස්පර්ශත් මෙහෙයවල වේදනාවත් මෙහෙයවල තමනුත් ඉතින් කර්මයක් මෙහෙයවීමේ manager වැඩේ කරනවා. එතකොට ඒක නිසා තමයි හැමකෙනාටම මේ බණ ඇහීම කියන එක කරන්න පුළුවන් කම තියෙන්නේ. දැන් ඔය චේතනා ගතිය කෙනෙකුගේ හිතේ නැත්නම් හිත තිබුන නිසාම මේක අහන්න බෑ. හිතක් තිබුන නිසාම අහන්න බෑ. ඒ හිත - වේදනාව - ස්පර්ශය මෙහෙයවන්ට මේ චේතනා ගුණය ඒකට බහින්න ඕනෑ. ඒ චේතනා ගුණය ඒකෙ පහළ වෙන්ට ඕනෑ. හැම එක්කෙනාගේම සිත් තුල ඒ සහජාත චේතනාව තියෙනවා. ඒක නිසා තමයි ඇහුන්කන් දීගෙන හිත හිතා මෙනෙහි කරගෙන මේ පැත්තට හැරිලා වැටිලා මේ අහගෙන ඉන්නේ. මේක මනෝමය ධර්‍ම ස්වභාවයක්. මේක යම්කිසි උද්යෝගා ක්‍රමයක්. හිත උත්සාහවත් කරන එකක්. හිත උද්යෝගාමත් කරන එකක්. විර්ය නෙමෙයි. මම වචනයක් පාවිච්චි කරා හිත උත්සාහවත් කරනවා - උද්යෝගාමත් කරනවා කියල - කෙනෙකුට හිතෙන්න පුළුවන් ඔය කියන්නේ විර්ය කියල - නෑ. විර්යට විර්යය ගතිය ඇති කරන්ටත් මේක බලපාන්න ඕන. මේ චේතනාව කියන එක හරි අමුතු - අනිත් ඒවා මෙහෙයවන්ට පුළුවන් හැකියාවක් තියෙන එකක්. දැන් මේ චේතනාව කියල කියන්නේ චෛතසිකයක්. හැබැයි චෛතසිකය පොඩියි හිත ලොකුයි. අනිත් ධර්‍ම සියුම්. මේ චේතනාව පහළ වෙන්නේ හිත ඇතුලේ - හිතත් එක්ක. හිත තමයි මහ ගෙදර. චේතනාව ඒකෙ අනු කණ්ඩයක්. හැබැයි අනු කණ්ඩයක් උනාට බලය වැඩියි. හයිය වැඩියි. හරියට වාහනයක තිබෙන්නාවූ එන්ජින් එක වගේ. වාහනය ගත්තයින් පස්සේ සමහර විට සීට් තිබෙනවා ලොකුයි. ඒවාගේම body එක ලොකුයි. එන්ජින් එකක් විතරක් තිබෙන කොටස ඒ වාහනේ

තරම්ම ලොකු නෑ - කොටසක් විතරයි. නමුත් ඒකට තිබෙනවා අර ඒ එන්ජින් එකත් අරගෙන ඒවාගේම රෝද කරකවාගෙන ඊළඟට වාහනය ඉස්සරහට ගෙනියන්න පුළුවන් හයියක් හත්තියක් ඒකෙ තියෙනවා - ඒක කොටසක් උනාට.

ඒවාගේම තමයි මම තව කාරණයක් මේ පින්වතුන්ට සරලව තේරුම් ගන්ට කියන්න කැමතියි - මේක මම මීට ඉස්සරවෙලත් වාරයක් කියල තියෙනවයි කියල මගේ හිතේ කල්පනාව. අපි හිතමු මෙහෙම අම්ම කෙනෙක් පුංචි දරුවෙක් එක්ක යනවා Supermarket එකට. පුංචි දරුවෙක් එකක් යනවා. අම්මා ලොකුයි - අම්මට පුළුවන් මේ පුංචි දරුවාව වඩාගෙන යන්න. අම්මට තිබෙනවා ඒ පොඩි දරුවාව වඩා ගැනීමේ හැකියාව. දරුවා පුංචියි. එතකොට එයාට ටිකක් ඉතින් ඇවිදින්න පුළුවන්. දැන් මේ දරුවාත් එක්ක අම්ම Supermarket එකේ ඇවිදගෙන යනවා. එතකොට දරුවා අම්මගේ අතේ එල්ලිලා ඉන්නේ. දරුවා යන්නෙත් අම්මගේ උදව්වෙන්. එක වෙලාවක මේ දරුවට පේනවා සෙල්ලම් බඩු. මේ දරුවා සෙල්ලම්බඩු වලට ආස කරනවා. ආස කරලා අම්මගේ අතින් අදිනවා ඒ සෙල්ලම්බඩු පැත්තට. අම්මට ඒ දරුවාව ඇදගෙන යන්න බෑ. අම්මට හැරෙන්න සිද්ධ වෙනවා. ඒ පොඩි දරුවා පුංචි උනාට අම්ම ඒ සෙල්ලම්බඩු පැත්තට දරුවත් එක්ක යනවා. දරුවා අදිනවා ඒ පැත්තට. එතකොට ඒ අම්ම ඒ දරුවට අවනත වෙනවා. ඒ දරුවා යං කියන පැත්තට යනවා. ඒක කරන්ට සිද්ධ වෙනවා අම්මට. ඒක නිසා මේකෙන් තේරුම් ගන්ට ඕනෑ දරුවා පුංචි උනාට ලොකු - වැඩිහිටි - උස - අම්මව තමන්ගේ පැත්තට යොමු කරගන්න පුළුවන් ගැම්මක් තියෙන හින්ද තමයි ඒ දරුවාට ඒ අම්මත් එක්ක සෙල්ලම්බඩු තියෙන පැත්තට යන්න පුළුවන් කම තිබුනේ. ඒවගේ මේ චේතනාව කියන ගුණය සිතේ චෛතසිකයක් හැටියට පහළ උනාට - ඉපදුනාට ඒකෙ තිබෙන හයිය හත්තිය නිසා ඒ චේතනාවට පුළුවන් හිත මෙහෙයවන්ට - අනිත් චෛතසික ධර්ම මෙහෙයවන්ට පුළුවන්. එහෙම හැකියාවක් තිබෙනවා. එතකොට අපි මේ බණ ඇසීමේ ක්‍රියාව සිද්ධ කරනකොට අපේ හිත මේ පැත්තට හරවන්ට මෙහෙයවන්නේ චේතනාවෙන්. ඔය වචන එක එක වචනයක් පාසාම ඒ වචන වලට හිත ස්පර්ශ කරවන්ට මෙහෙයවන්නේ චේතනාවෙන්. වචන වල තිබෙන්නාවූ ප්‍රනීත හොඳ නරක උපේක්ෂා ගතිය විඳවන්ට - වේදනාව මෙහෙයවන්නේ චේතනාවයි. ඒක නිසා මේ චේතනාව - චෛතසික - සිත් - කියල කියන්නේ නොපෙන්නාවූ මනෝමය ධර්ම team එකක්. මනෝමය ධර්ම රංචුවක් - team එකක්. මේ team එකේ leader හැටියට ඉන්න manager හැටියට ඉන්න මේ චේතනාව මහා බලවත් කටයුත්තක් කරනවා. ඒක නිසා හැම ක්‍රියාවකටම මේ චේතනාව leading part එක කරනවා. ඒ කියන්නේ ප්‍රධාන කොටස කරනවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ **"චේතනාහං භික්ඛවේ කම්ම වදාමි"** යන බණ පදය දේශනා කරනවා. "මහණෙනි මම මේ චේතනාව කියන එක කර්මය කියල සඳහන් කරනවා" කියල දේශනා කරනවා. දැන් ඔය බලය ශක්තිය හැමකෙනාටම තියෙනවා. හැම එකෙනාගේම සිත්වල තියෙනවා. ඊළඟට රහතන්වහන්සේගේ හිතෙත් තියෙනවා. රහතන්වහන්සේට පිණ්ඩපාතෙ යන්න ඕනේ කියල හිතුනහම රහතන්වහන්සේගේ ඒ රූපස්කන්ධය ඒ පාරක් දිගේ වඩමවාගෙන පියවරක් පියවරක් පාසාම ගෙන යන්න පුළුවන් - ඒ රහතන්වහන්සේගේ කය පිණ්ඩපාත ක්‍රියාවේ ගමන් කරවන ක්‍රියාව සිද්ධ කරන්න පුළුවන් හැකියාව ඒ උන්වහන්සේගේ හිතේ පහළ වෙන චේතනාවට තියෙනවා. රහතන්වහන්සේ බණ දේශනාවක් කරනවා. බණ දේශනාවක් කරන කොට

රහතන්වහන්සේගේ හිතෙත් ඒ බණ දේශනාවට වචන ගලපන ඒ චේතනා කරන ගතිය උන්වහන්සේගේ හිතේ තියෙනවා. ඒක නිසා සහජාත ක්‍රියාව එහෙම නැත්නම් චේතනාව පහළ වෙනවා රහතන්වහන්සේගේ හිතේ. ඊළඟට රහතන්වහන්සේ අසරණ මනුස්සයෙකුට එහෙම නැත්නම් පිණ්ඩපාතය වළඳලා ඉවරවෙලා අසරණ මනුස්සයෙකුට කෑම ටිකක් දෙනවා. ඒ දීමේ ක්‍රියාවටත් උනවහ්සේට චේතනා පහළ වෙනවා - සහජාත චේතනා. උන්වහන්සේ බණ දේශනා කරනවා - ඒ බණ දේශනා කරනකොට චේතනා පහළ වෙනවා - බුද්ධ උපස්ථාන කරනවා - බුද්ධ උපස්ථාන සිද්ධ කරන කොට චේතනාව පහළ වෙනවා. දැන් මේ රහතන්වහන්සේ නමක්. මේ රහතන්වහන්සේ කරන හැම ක්‍රියාවකටම - බණ කීමේ ක්‍රියාවට - සක්මන් කිරීමේ ක්‍රියාවට - වැඩම කිරීමේ ක්‍රියාවට - අසරණයෙකුට කෑම ටිකක් දෙන ක්‍රියාවට - බුද්ධ උපස්ථාන කරන ක්‍රියාවට හැම එකටම මේ රහතන්වහන්සේගේ ඒ චේතනාව ක්‍රියාවේ යොදවනවා. ඒක එක විදියක එකක්.

ඊළඟට තියෙනවා පෘතක්ජන භික්ෂූන් වහන්සේ නමක් පිණ්ඩපාතයේ වඩිනවා. ඒ පිණ්ඩපාතයේ වඩින කොට  උන්වහන්සේගේ හිතෙත් පහළ වෙනවා චේතනාව. පෘතක්ජන භික්ෂූන් වහන්සේ නමක් බණ දේශනා කරනවා. චේතනාව පහළ වෙනවා. පෘතක්ජන භික්ෂූන් වහන්සේ නමක් අසරණයෙකුට උදව් උපකාර  කරනවා. කෑම ටිකක් දීල - ඒ ක්‍රියාවටත් චේතනාව අවශ්‍ය යයි - පහළ වෙනවා. ඊළඟට පෘතක්ජන භික්ෂූන් වහන්සේ නමක් බුද්ධ උපස්ථාන  කරනවා - පැන් තියනවා - වත් පිළිවෙත් කරනවා. එතකොටත් චේතනාව අවශ්‍ය යයි - පහළ වෙනවා. එතකොට චේතනාව පෘතක්ජන භික්ෂූන් වහන්සේගේත් තිබෙනවා අර රහතන්වහන්සේගේ හිතෙත් තිබෙනවා. වෙනසක් තිබෙනවා රහතන් වහන්සේගේ හිතේ චේතනාව පහළ උනාට උන්වහසේගේ ඒ වෙලාවට කරන ක්‍රියාවට පමණක් මේ චේතනාව සීමා වෙනවා. එතැනින් එහාට Registration එකක් තබන්ට එතනින් එහාට ශක්තියක් ඉතිරි කරන්ට හැකියාව ඒ චේතනාවට නෑ. ඒකනිසා කියනව අනාගතේට සම්බන්ධයක් නැති චේතනාව ක්‍රියා මාත්‍රය පමණක් කියල. පෘතක්ජන භික්ෂූන් වහන්සේ බණ දේශනා කරනවා පිණ්ඩපාතේ යනවා - සක්මන් කරනවා - උදව් උපකාර කරනවා - බුද්ධ උපස්ථාන කරනවා.  පෘතක්ජන භික්ෂූන් වහන්සේ හිතේ ඒ වෙලාවට ඒ ක්‍රියාවටත් ඒ ක්‍රියාව කිරීමට චේතනාව පහළ වෙන බව හැබෑව - සක්මන් කිරීමේ චේතනා පහළ වෙනවා. බණ දේශනා කිරීමේ ක්‍රියාවට චේතනාව පහළ වෙනවා. ඒවාගේම බුද්ධ උපස්ථාන කිරීමට චේතනා පහළ වෙනවා. ඒ ක්‍රියාව ඒ වෙලාවට කරනවා. හැබැයි ඒ වෙලාවට කරනවා වගේම තමයි පෘතක්ජන භික්ෂූන් වහන්සේගේ හිතේ තියෙන ඒ චේතනාව ඇතිවෙලා නැති වෙලා යනකොට ක්‍රියාව ඉවරවෙනවා ක්‍රියාව මැරී යනකොට චේතනාවත් නැතිවෙලා යනව හැබැයි නැතිවෙලා ගියාට නැත්තටම නැතිවෙලා යන්නේ නෑ. ඒකෙ මොකක් හරි නිකං හුමාලයක් - ඒකෙ මොකක් හරි දුම් ගතියක්  - එහෙම නැත්නම් මොකක් හරි රස්නේ ගතියක් - මොකක් හරි ශක්තියක් අනාගත සම්බන්ධතාවයකට හේත්තු වෙන විදියේ එකක් ශක්තියක් හදල තමයි ඒක නැතිවෙලා යන්නේ. ඔන්න ඔහොම ගතියක් ඕකේ තියෙනවා - ඕකට කියනවා කර්මය කියල. රහතන්වහන්සේට අනාගතයට සම්බන්ධයෙන් සිද්ධ වෙන්නේ නෑ. හැබැයි ඒ 'හිත' ක්‍රියාවේ මෙහෙයවනවා ක්‍රියාවේ යොදනවා. පෘතක්ජන භික්ෂූන් වහන්සේගේ චේතනාවත් ක්‍රියාවේ යොදනවා මෙහෙයවනවා.

දැන් මෙතන මේ කර්ම ප්‍රත්‍යය - දැන් කියාගෙන ආවනේ **'හෙතුපච්චයො, ආරම්මණපච්චයො, අධිපතිපච්චයො, අනන්තරපච්චයො, සමනන්තරපච්චයො, සහජාතපච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයො, නිස්සයපච්චයො, උපනිස්සයපච්චයො, පුරෙජාතපච්චයො, පච්ඡාජාතපච්චයො, ආසෙවනපච්චයො, කම්මපච්චයො...** වශයෙන් කියාගෙන ආවනේ දැන් අද ඉන්නේ **'කම්ම ප්‍රත්‍යයේ'**.

**'කම්ම ප්‍රත්‍යය'** කියන තැන කර්මය කියන මේ චේතනාව ප්‍රත්‍යය වෙනවා -උපකාර වෙනවා අනෙත් සිත් සහ චෛතසික ධර්මයන්ටත් සහ සමහරවෙලාවට රූපයන්ටත්. දැන් මේ බණ අහගෙන ඉන්න වෙලාවේ ඔය පහළ වෙනවනේ තමන්ට නොදැනී නොපෙනී සිත් ටිකක්. තමන්ට නොදැනී සිත් ටිකක් පහළ වෙනවා. හැබැයි ඒ සිත් තම තමන්ට අවශ්‍ය තම තමන්ට අදාල ඒ ක්‍රියාවල් ටික සිද්ධ කරනවා. බණ ඇසීමේ ක්‍රියාව. දැන් මේ කටයුත්තට මේ පින්වතුන්ගේ හිත්වල චේතනාව හරි බලවත්ලෙස මෙහෙයවනවා. මෙහයවන මේ වෙලාවේ තිබෙනවනේ සිත. ඒවාගේම තමයි මේ චේතනාව - මේ ක්‍රියාව - බණ ඇසීමේ ක්‍රියාව කරලා නතර වෙනකොට අනාගතයට මේ සැම කෙනාටම යම්කිසි ගුණ විශේෂයක් - ශක්ති විශේෂයක් ඉතුරු පහදු වෙනවා. එහෙම වෙනවා. ඒකනිසා අපි ඒකට කියනවා බණ ඇසීමෙන් ලබන්නාවූ පින කියල. දැන් මෙච්චර වෙලාවක්ම මම මේ කියල දුන්නේ මේ චේතනාවේ තිබෙන්නාවූ පොඩි වෙනස්කමක්.

චේතනාව තිබෙනවා **'සහජාත චේතනාව' 'නා නා ක්ෂණයක චේතනාව'** යනුවෙන්. මේකෙන් අපි 'සහජාත චේතනාව' පිළිබඳව පොඩ්ඩක් හිතමු. ඒ කියන්නේ 'කර්ම ප්‍රත්‍යය' මේ 'චේතනාව' කියල ගත්තට 'කර්මය' තියෙන්නේ. කර්මය කර්මය කර්මය කියන එකෙන් කියන්නෙම චේතනාවයි. එතකොට සහජාත 'කර්ම ප්‍රත්‍යය' සහ 'සහජාත කර්මයේ ප්‍රත්‍යය උපන්න ගතිය'. මම මේක ටිකක් කියල මම නවත්වනවා. නවත්වලා මම කැමතියි ඉතිරි කාලය තුල මේ පින්වතුන් ග්‍රහණය කරගත්තු විදිය තේරුම් ගන්ට. හැම එක්කෙනාටම ඒකට අවස්ථාව සලසලා දෙනවා. බලන්ට හිත් 89 කිව්වනේ. හිත් 89 යේම චේතනාව පහළ වෙනවා කියල කිව්වනේ. හිත් 89 එකට අරගෙන මේක කථා කරන්ට ගියාම තරමක් තේරුම් ගන්ට අමාරු වෙන්ට පුළුවන්. අපි එකක් ගමු. සිත් 89 යේම චේතනාව පහළ වෙනවා කියල විතරක් දැනගන්ට. ඒක සහජාත චේතනාව. අපි ඒ 89 න්එකක් ගමු.

අපි නිතර පාවිච්චි කරනවා කර්ම - ඒ කියන්නේ කුසල කර්මයක් ගමු - බණ ඇසීමේ එකත් එක්ක. දැන් මේ බණ ඇසීම පිංකමක්. බණ ඇසීමේ ක්‍රියාව සිද්ධ වෙන මේ වෙලාවේ අපිට පවු සිතකින් බණ අහන්ට බෑ. පින් සිතකින් තමයි බණ අහන්න පුළුවන්. පින් සිතේ පහළ වෙනවා - මේ පින්වතුන් මේ බණ අහන සිතේ පහළ වෙනවා මෙන්න මෙච්චරක් ධර්ම. ඒ කියන්නේ ඔය චේතනාවත් එක්ක පහළ වෙනවා චෛතසික ධර්ම 33ක්. ඒ චෛතසික ධර්ම 33 යි ඒ චෛතසික පහළ වෙන හිතයි ගත්තයින් පස්සේ 34 යි. චෛතසික ධර්ම 33 + සිතයි = 34 යි. ඔය 34 ට කියනවා 'නාම ධර්ම කාණ්ඩය' – 'නාම ධර්ම පිණ්ඩය' කියල. ඔය චෛතසික 33 න් එක්කෙනෙක් සලකනවා කර්මය කියල. ඒ තමයි චේතනාව කියල කියන්නාවූ චෛතසිකය. ඔය චේතනාව කියන 'චෛතසිකය' අනිත් 'චෛතසික 32' යි

'හිතයි' ඔක්කොම ටික තමන්ගේ යටතේ මෙහෙයවනවා. ඒ මෙහෙය වන හින්ද තමයි බණ අහන්නේ. මේ බණ ඇසීමේ ක්‍රියාවට යොදවනවා. ඒ විතරක් නෙමෙයි ඇසීමේ ක්‍රියාව - මේ රූප - ඒ වෙලාවේදී රූපත් හද හදා තමයි මේක අස්සවන්නේ. මේ බණ ඇසීමේ ක්‍රියාව සිද්ධ කරවන්නේ ඒකත් එක්කයි - රූප හද හදා. දැන් බලන්න - ඒ බණ ඇසීමේ ක්‍රියාව සිද්ධ වෙන තැන 'චේතනාව' කියන්නේ 'කර්මය' අනිත් 'චෛතසික ධර්ම' සහ 'සිත' 'රූප' මේ චේතනාවට යටත්ව - චේතනාවේ තිබෙන ඒ manager ගතිය - ඒ බලවත් මෙහෙය වීමට යටත් වෙනවා. යටත්වෙන නිසා තමයි මේ පින්වතුන්ගේ මේ බණ ඇසීම සිද්ධ වෙන්නේ. එහෙම නැති උනොත් යම්කිසි විධියකින් මේ චේතනාව ඔය සිතේ නැති උනොත් මේ අයගේ හිත්වල පහළ වෙන්නාවූ චෛතසික ධර්ම හතිකොන යනවා. දැන් හිතල බලන්න උදාහරණයක් හැටියට වැඩපොළක manager නෑ. නෑ කියල හිතන්නකෝ. වැඩ පොළක manager නැති උනායින් පස්සේ මොකද වෙන්නේ? මිනුස්සු කථා කර කර ඉන්නවා. විහිළු කරනවා - කථා කරනවා - වැඩ නවත්වනවා. ඒගොලන්ට ඕන ඕන පැතිවල යනවා. Machine එහෙක වැඩ කරනවානම් machine එකේ ඉන්නේ නෑ. පුටුවක වාඩිවෙලා වැඩ කරනවා නම් එතැන ඉන්නේ නෑ. ඒ ගොල්ලන්ගේ පෞද්ගලික දේවල් වලට යොමුවෙලා බැහැර වෙලා යනවා. Manager නැති උනාට පස්සේ ඕක වෙනවා. manager ඉන්න වෙලාවට එයාගේ මෙහෙය වීමට යටත් වෙලා ඒ අය නියම පිළිවෙලට වැඩ කරනවා. චේතනාව කියන එකත් ඔය වගේ team work එකේ ප්‍රධානත්වය ධරනවා. එතකොට චේතනාව තමයි කර්ම ප්‍රත්‍යය ඒ කර්ම ප්‍රත්‍යය යටත්ව ක්‍රියාත්මක වෙන්නාවූ සිත සහ අනිත් චෛතසික ධර්මත් එක්ක රූප ධර්ම ටික තමයි ප්‍රත්‍යය උපන්න ධර්ම කියල කියන්නේ. ප්‍රත්‍යය උප්පන්න ධර්ම සමුදාය. ඒක නිසා හැම සිතකම චේතනාව ඒ වෙලාවට 'කර්මයයි'. අනිත් සිත සහ චෛතසික ධර්ම ටික සහ රූප ටික ඇවිල්ල 'ප්‍රත්‍යය උපන්න' ධර්මයයි. ඔන්න ඔය විදියට තමයි සහජාත කර්ම ප්‍රත්‍යයයාගේ කර්ම ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න භාවය දැනගන්නේ. දැන් ඔය කථා කරන්නේ කුසල කර්මයකට අනුකූලව. දැන් තව එක කථාවක් කිව්වා - මෙන්න මෙහෙම එකක්.

හිතක් පහළ වෙනකොට රූප ගැනත් කිව්වනේ. ඔය රූප පහළ කරන සිත් තියෙනවා. හැම සිතක්ම පහළ වෙනකොට ඒවගේ රූප උපදවන ගතියකුත් තිබෙනවා. ඔය සමහර සිත්වල - විඤ්ඤාණ සිත්වල නෑ - නමුත් අනිත් සිත්වල තියෙනවා රූප උපදවන්නාවූ ගතිය. ඒවාට කියනවා චිත්තජ රූප කියල. සිතක් උපදින කොට නාමධර්ම අනිත් ඒවා පහළ වෙනවා. ඒවාගේම රූප ටිකකුත් ඒ එක්කම ගොඩවෙලා මතුවෙලා එනවා. ඒ නිසා මේ චේතනාව - 'සහජාත කර්ම' - ඊළඟට 'කර්ම ප්‍රත්‍යය උප්පන්න' කියන ආකාර දෙකේ ඔය විදියට තමයි අපි සරලව තේරුම් ගන්ට ඕනේ වෙන්නේ. මේක ඉවර නෑ. මේ කිව්වේ සහජාත කර්ම ප්‍රත්‍යය යම්කිසි ක්‍රියාවකට අනුව ගොඩනැගී ක්‍රියාත්මක වෙන හැඩවෙන ආකාරයයි. තව තියෙනවා එකක් කියන්න. ඒ තමයි 'නා නා ක්ෂණයක කර්ම ස්වභාවය' – 'නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය'. ඒ 'නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය' ටිකක් ගාම්භීරව කියන්න වෙනවා. ඒක නිසා අද දවසට ඒක පටලවා ගන්නේ නෑ. ඒක වෙනම තිබුනොත් තමයි හොඳට මේ පින්වතුන්ට තේරෙන්නේ වැටහෙන්නේ. හැබැයි ඉක්මන් කරලා කියල දෙන්න පුලුවන් එහෙම උනාම මදි - හිත්වලට යන්නේ නෑ. දැන් හොඳට තේරුම් ගන්න. කර්මය කියල කියන්නේ චේතනාව. අද මේ කථා කරන කර්ම ප්‍රත්‍යයයේ තිබෙනවා ආකාර දෙකක්. ඒ ආකාර දෙක තමයි **'සහජාත කර්ම ප්‍රත්‍යය ස්වභාවය'** සහ **'නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය**

**ස්වභාවය'**. අද මේ පින්වතුන්ට මම ඒ විධි දෙකින් **'සහජාත කර්ම ප්‍රත්‍යය'** තමයි කියල දෙන්නේ.

අපි හිතමු මෙහෙම - දැන් මේ පින්වතුන් බණ අහගෙන ඉන්නකොට අහපු නැති බණක් - නොකියවෙච්ච බණක් තේරෙන්නේ පටන් ගන්නවා. අහපු නැති බණක් අහන්න ලැබෙනවා. මෙහෙම ඉන්නකොට තමන්ගේ හිතේ අමුතු විදියක සන්තෝසයක් ඇතිවෙනවා වගේම තමන්ට කයටත් දැනෙනවා - හරිම සැහැල්ලු ශාන්ත - ඒවාගේම සැප ගතියක් ඇති වෙනවා. ඒක රූප ස්වභාවයක්. එතකොට මේ වෙලාවේ රූපත් පහළ වෙනවනේ සහජාත චේතනාවත් එක්ක. ඔය විදියට ප්‍රායෝගිකව අපි මේ තුල ඒකත් දැන ගන්න ඕනේ. දැන් මේ පට්ඨානය කථාවේදී අපි ඔය පොතේ තියෙන වචන ටිකම පාඩම් කරලා පාඩම් කරලා ඒක පිළිවෙලට දාන් board එකේ දාන්න වගේ එහෙම නැත්නම් chart ගත කරන්න වගේ ඕක කරගෙන යන්න පුළුවන්. ඕකම නෙමෙයි ඇත්ත වශයෙන්ම අභිධර්මය ඉගෙනගැනීම නිසා සලකා බැලීමේ ප්‍රධාන කාර්ය. අපි මේ ජීවිතියේ - මේ වෙලාවේ - මේ කියන්නාවූ ස්වරූපයට මෙහෙම සිද්ධ වෙනවා කියල අපි යෝනිසෝමනසිකාරය සිහිය නුවණ දාල බලන්න ඕනෑ. එතකොට තමයි හොඳට කාරණය තේරෙන්නේ. ඒක භාවනාවක් වෙනවා. ඒවාගේම - ඒක ධර්ම හොඳට පැහැදිලිව තේරුම් ගන්ට උපකාරක මනසිකාර ගුණයක් වෙනවා. ඒකනිසා සහජාත කර්මය කියන කර්ම ශක්තිය ඔය විදියට තෙරුම්ගන්ට. හැම සිතකම - රහතන්වහන්සේගේ සිතෙත් තිබෙනවා චේතනාව - පෘතක්ජන හිතෙත් තියෙනවා චේතනාව. ඒවෙලාවට ඒ චේතනාව ගිහිල්ල ඒ චේතනාව පහළ වෙලා ඒ සිතින් කරන වැඩේ කරීමට - කරවීමට අනිත් චේතනා සහ අනිත් චෛතසික ධර්ම සහ හිතව මෙහයවනවා - ආන්න ඒ ස්වභාවය තමයි අද මේ පින්වතුන්ට කියල දුන්නේ.

ඒනිසා කලබල වෙන්නේ නැතුව හොඳට හිතල තේරුම් ගන්න. මේ හැම සිතකම පහළ වෙන මේ චේතනා ගුණය - කර්මය - කර්ම ගුණය - ක්‍රියාවක් කරවන්ට මෙහෙයවන ගතිය. අපෙත් ඒවාගේම අනිත් රූපාවචර සත්වයන්ගේත් අරූපාවචර සත්වයන්ගේ සන්තාන වලත් ලෝකෝත්තර සිත්වලත් තිබෙනවා. නැති තැන දෙකක් තිබෙනවා - **'චේතනාව'**. ඒ තමයි නිර්වාණ ධාතුව අවබෝධ කරගත්තයින් පස්සේ යම් කිසිකෙනෙක් නිවන් අවබෝධ කරගත්තහම නිවනේ නෑ. හැබැයි ඵල සමාපත්තියේ තියෙනවා. ඵල සමාපත්තිය කියල කියන්නේ නිවන් අවබෝධ කරගත්තා වූ කෙනා සමාපත්තියකට සමවදිනවා - ඒ සමාපත්තියට කියනවා ඵල සමාපත්තිය කියල. නිවන් තමයි අරමුණු වෙන්නේ. ඒ නිවනේ මොකක්වත් එහෙම පාටක් අරකක් මේකක් නෑ. ඒක අසංඛත ධාතුවක්. ඒ අසංඛත ධාතුව අරමුණු කරන්නාවූ ලෝකෝත්තර සිතෙත් චේතනාව තිබෙනවා. නමුත් නිවනේ සිත් නෑ. අනිත් ස්ථානය තමයි නිරෝධ සමාපත්තියට සමවැදුනට පස්සේ. එතන නිරෝධ සමාපත්තියට සමවැදුනට පස්සේ එතන හිත නවතිනවා. ඒක නිසා චේතනාව පහළ වෙන්නේ නෑ. තව ස්ථානයක් තිබෙනවා අසංඥ තලය කියල. අසංඥ තලය කියන සත්ව කොට්ඨාසයේ තිබෙන්නේ රූප ගොඩක් විතරයි. නිකම්ම නිකම් කර්මයෙන් හටගත්තු රූප ගොඩක් තිබෙනවා එක්තරා කාල පරිච්ඡේදයක්. ඒ ඇරෙන්ට වෙන මොකක්වත් නෑ. ඒක නිසා හිතක් පහළ වෙන්නේ නැතිනිසා එතනත් සහජාත චේතනාවක් කියල එකක් නෑ. ඔය

ස්ථාන දෙකේ ඇරෙන්න අනිත් තැන්වල සහජාත චේතනාව තියෙනවා . ඒක හොඳට තේරුම් ගන්ට අවබෝධ කරගන්ට. අපේ මේ පින්වත් සැම දෙනාම ගාම්භීර ධර්ම කොට්ඨාසයක් හිතට වද්දාගෙන අහගෙන ඒ කොටස තනියෙන් මෙනෙහි කරන්ට බලාගෙන ඉන්නාවූ පිරිසක්. අපි බොහෝම මෛත්‍රීයෙන් සිහිපත් කරනවා සහ පින්දෙනවා ලෝකයේ ගොඩක් ඉතින් ධර්මය කථා කරනවා නමුත් මේ වාගේ ගාම්භීර පැති කථා කරන පැති බොහෝම සීමිත ප්‍රමාණයයි තියෙන්නේ. ඒ නිසා ඒවාට යොමුවෙලා ඉන්නාවූ පිරිසත් බොහෝම සීමිතයි. මේ අපේ පින්වතුන් සැමදෙනාම මේ ප්‍රත්‍යය කථාවල් අහන්න - පට්ඨාන ධර්ම අහන්න - ශ්‍රවණය කරන්න ඉදිරිපත්වෙලා ඉන්නේ බොහොම ශ්‍රද්ධාවෙන් හැඟීමෙන්. එනිසා මම අද මේ පින්වතුන්ට මෙතකින් මේ ටික නවත්වනවා. ඉතිරි කාලය තුල අපිට පුළුවන් සාකච්ඡාවක් කරන්ට. මේ පින්වතුන්ට ඇති වෙන්නාවූ දහම් ගැටළු සහ හිතන්නාවූ විදියත් එක්ක.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ එක ධර්ම මණ්ඩලයක - ඒ කියන්නේ අපේ හිතේ පහළවෙන චෛතසික ධර්ම රංචුවත් - ඒ මණ්ඩලයත් - හිතත් - අනිත් ධර්මත් වෙන වෙනම වෙන වෙනම අඳුනාගත්තා තේරුම් ගත්තා ඒවාගේම ඒවගේ තිබෙන හැඩ ලක්ෂණය ක්‍රියාවල් හැම එකක්ම තේරුම් ගත්තා. මහා විසාල අවබෝධයක් ගාම්භීර අවබෝධයක් සුක්ෂම ක්‍රියා අවබෝධයක් ලබාගත්ත හැබැයි කිසිම ධර්මයකට - කිසිම දේකට උන්වහන්සේ ඇලුනේ නෑ බැඳුණේ නෑ. ඒවා අගේ කළේ නෑ. උන්වහන්සේ එකම දෙයයි කළේ. මේ විදියට පහළ වෙන්නාවූ ධර්ම වලින් හේතුවලින් හේතු වලින් හටගන්නාවූ දේවල් වලින් මිදෙන්ට ඒ නිසා උන්වහන්සේගේ ඒ අවබෝධ කරගත්ත ධර්ම ඥානය අතිශය ගම්භීරයි. ඒනිසා ඒ ධර්මය අවබෝධ කරගත්ත ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට නැවත වතාවක් අපගේ නමස්කාරය වේවා! උන්වහන්සේගේ ධර්මය අසාගෙන මේ දක්වාම ලෝකයේ මොන කරදර කම්කටොලු බාධක චෝදනා ගැරහිලි අවමන් නින්දා අපහාස තිබුනත් ඒවා ඉතාමත්ම හොඳින් සුරක්ෂිතව රැකගෙන අවාවූ ඒ ගෞරවණීය මහා සංඝරත්නයට ගරුතර ස්වාමීන් වහන්සේලාටත් අපගේ නමස්කාරය වේවා! ඒ ධර්මයටත් අපගේ නමස්කාරය වේවා! මේ පින්වත් හැම දෙනාටම මේ ධර්මය හොඳට නිවැරදිව තේරුම් අරගෙන ගුණ පුරාගෙන කෙලවර අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස මේ ධර්මය සැමදෙනාට පිහිට වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සෙත් පතනවා සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ! ස්වාමීන්වහන්ස ඉතාමත් පිං අද අපිට මේ වගේ ධර්ම දේශනාවක් මතු කරලා මේ කරුණු අපිට මේ ආකාරයෙන් නිදර්ශන සහිතව කියාදීම පිළිබඳව ස්වාමීන්වහන්ස. එහෙමනම් අපි කල්‍යාණ මිත්‍රයන්ට යොමුවෙනවා අද දේශනාව තුලදී මේ සහජාත කර්ම ප්‍රත්‍යය විස්තරය අනුව තව දුරටත් යම්දෙයක් පැහැදිලි කරගන්න තියෙනවනම්.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! අවසරයි ගෞරවණීය ස්වාමීන්වහන්ස ඔබවහන්සේගේ පාද නමස්කාර පූර්වකව මේ ප්‍රශ්නය අහන්නේ. ස්වාමීන්වහන්ස මට පැහැදිලි උනේ මේ වගේ. සහජාත චේතනාව සැම සිතකම වැඩ කරනවා. සහජාත චේතනාව වැඩ නොකරන සිතුත්

තියෙනවා කියල වගේ අවබෝධ උනේ ස්වාමීන්වහන්ස ඒක හරිද කියල පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. තෙරුවන් සරණයි!

පිළිතුර - 'සහජාත චේතනාව' සෑම සිතකම පහළ වෙනවා 'නා නා ක්ෂණික චේතනාව' හැම හිතකම පහළ වෙන්නේ නෑ. ඒක හරි.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස දැන් රූප වල චේතනාව පහළ වෙනවා කිව්වා. එතකොට චිත්තජ රූප .. අසංඥ සත්ව කර්මජ රූප නැතුව අනිත් රූප වලත් ස්වාමීන්වහන්ස ඍතුජ ආහාරජ ප්‍රවෘති කර්මජ රූප ආදියෙත් චේතනාව පහළ වෙනවද කියල පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. බොහොම පින්.

පිළිතුර - එතනනම් හරි පරෙස්සමෙන් රූප සම්බන්ධයෙන් අතපත ගහන්න වෙනවා. හේතුව මම නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය පිළිබඳව වැඩියට මේ වෙලාවේ කථා කරන්නේ නෑ. සහජාත චේතනාව පිළිබඳව විතරක් කථා කරනවා. ඒකෙ හේතුව යම්කිසි පටලැවිල්ලක් වෙන්න පුළුවන් යයි කියන සැක සංකාව නිසා. මෙතන හැබැයි සලකා ගන්නේ - අපිට හිතක් පහළ වෙන වෙලාවේ ඒ සිත පහළ වෙන කොටම - ඒ සිතේ බලයෙන් - සිතේ ශක්තියෙන් ඇතිවෙනවනේ රූප පහළවීමක් - ඒකට කියනවා චිත්තජ රූප කියල. ඒ චිත්තජ රූපයන්ට ඔය චේතනාවේ - සිතේ සම්බන්ධයක් තියෙනවා. හැබැයි අනිත් ඒවාට ඒක නෑ. එතකොට චිත්තජ රූප කියන ඒවා ප්‍රත්‍යය උපන්න වගේම අනිත් ඒවගෙත් බලපෑමකින්නේ ඇතිවෙන්නේ. ඒකනිසා එතැනදී ප්‍රත්‍යය උපන්න ධර්ම ගනන් ගන්න කොට ඒක සලකනවා. හැබැයි කර්මය කියන එක පිළිබඳව නා නා ක්ෂණයක චේතනාවේ කර්මය තියෙනවා ඒක හැබැයි වෙනම කියල දෙනවා මම ඊළඟ අවස්ථාවේදී. හැබැයි අනිත් ඒවා ඒ කියන්නේ ඍතුජ රූප ඊළඟට ආහාරජ රූප මේකට යොදාගන්නේ නෑ. හේතුව ඒවා සිතින් හටගන්නා ඒවා - කර්මයෙන් හට ගන්න ඒවා නොවෙන නිසා. තෙරුවන් සරණයි!

බොහොම පින් ස්වාමීන්වහන්ස තේරුණා - එතකොට පටිසන්ධි කර්මජ රූප වලට චේතනාව බලපානවා නේද පටිසන්ධියට ..ඒකත් පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න

ස්වාමීන්වහන්සේ - පටිසන්ධි අවස්ථාවේදී බලපාන්නේ - චේතනාවත් බලපානවා. එතන තියෙනවා සහජාත චේතනාවක් ඒ රංචුවේ වැඩ කරන්න තියෙනවා. ඒවාගේම කර්ම බලයකුත් එතන තියෙනවා. එතන තියෙන්නේ ඇත්ත වශයෙන්ම කර්ම සම්බන්ධතාවය පමණයි. ඒ රූප වලට පමණයි. තෙරුවන් සරණයි.

මේ ප්‍රශ්නය අහපු මහත්මිය මොන මොනවා හරි හොයන්න මහන්සිගන්න හිතපු බව හැබෑව. ඒක හොඳට තේරෙනවා ඒ ප්‍රශ්නයෙන්. ඒක හරි හොඳයි. එහෙම හොයන එක හොඳයි හැබැයි මේක මාතෘකා දෙහෙකට තමයි ගන්න ඕනෑ වෙන්නේ. ඒකෙ මාතෘකා දෙහෙකට අරගත්තයින් පස්සේ හොඳකම - පටලැවෙන්නේ නෑ. එතකොට අවුලක් වෙන්නේ නෑ. දැන් අපේ අනිත් පින්වතුන්ගෙන් උනත් ඇත්ත වශයෙන්ම මේ කථා කරන ඒවා මට සමහර වෙලාවට මම විශ්වාස කරනවා අපේ මේ පින්වත් සමහර මහත්ම මහත්මීන් මේවා සාකච්ඡා

කරලා දැනුමක් ලබාගන්නවයි කියල. හැම වෙලාවෙම මම කියනවට වඩා මම හරි ඕනෑකමකින් උද්‍යෝගයකින් අහගෙන ඉන්න කැමතියි අහන ප්‍රශ්න. එහෙම අහන ප්‍රශ්න තුලින් මට තේරෙනවා හැගෙනව මේ සිත් ටික කොයි හරියෙද මේ දඟලන්නේ කියල. අන්න එතකොට පුළුවන් යම්කිසිදෙයක් ඒකට එක්කාසු කරලා පැහැදිලි කරන්න. ඉතින් ඒකත් අපි බලාපොරොත්තු වෙනවා. ඉතින් අපි විස්වාස කරනවා මේ අයට මේක තේරෙනවා කියල. හොඳයි අපි බලමු ඉස්සරහට මොකද වෙන්නේ කියල. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස මම හිතුවේ ප්‍රත්‍යය ධර්මයි ප්‍රත්‍යය උපන්න ධර්මයි ප්‍රත්‍යනීක ධර්මයි වෙන්කරගන්න. බොහොම පිං!

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔය ධර්මයට සම්බන්ධ නැති ඒවා ඔක්කොම ප්‍රත්‍යනීකයි.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස මම තෙරුම් ගත්තු විදිය කියන්නම්. ඒකෙ අඩු පාඩුවක් තිබේනම් ඔබවහන්සේ කරුණාවෙන් ඒක සකස් කරලා දෙන්න. සහජාත කර්ම ප්‍රත්‍යය කියන කොට තේරුම් ගත්ත විදිය තමයි සෑම සිතකම එනම් සිත් 89 ක් අපි ඉගෙන ගන්නවා ඒ සෑම සිතකම තියෙන 'චේතනාව' තමයි 'සහජාත කර්ම ප්‍රත්‍යය' කියල කියන්නේ. හේතුව තමයි ඒක ප්‍රත්‍යය වෙලා සිතත් ඒ සිත්වල ඉපදෙන චෛතසික ටිකටත් සහජාත කර්ම ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක තමයි තේරුම් ගත්තේ. ඒවාගේම ඒ චෛතසික වලට අමතරව අපි දන්නවා විඤ්ඤාණ සිත් 10 ත් අරූපාවචර විපාක සිත් 4 යි ඒ සිත් 14 ට රූප උපද්දවන්න බැහැ. ඉතුරු සිත් 76 ම රූප උපදවන්න හැකි ශක්තිය තියෙනවා. ඒ සිත්වල තිබෙන චේතනාව එතකොට ඒ රූපවලටත් ප්‍රත්‍යය වෙන බව තමයි තේරුම් ගත්තේ සහජාත කර්ම ප්‍රත්‍යයෙන්. ඒවිදියට තේරුම් ගත්තොත් හරිද ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒ විදියට තේරුම් ගැනීම හොඳයි මහත්තය. ඒක හරි. එතකොට වචන භාවිතාව - අපේ මේ පින්වත් දැනුවත් කල්‍යාණමිත්‍ර මහත්මා මහත්මීන්ටත් එක්ක අපේ යම්කිසි අලුතෙන් සම්බන්ධ වෙච්ච පින්වතුන් ඉන්නවානම් ඒ අයටත් එක්කයි මේ කියන්නේ. අපි භාවිතාවේදී පාවිච්චි කරනවා මෙහෙම - 'මට හිතක් පහළ උනා මෙන්න මෙහෙම දෙයක් ගැන' අපි හිතමු ඒක පෘතක්ජන එක්කෙනෙක් කියනවයි කියල. එතකොට හිතක් පහළ උනා කියල කියනකොට ඒකෙදි අපිට ඔය චිත්ත චෛතසික ධර්ම පිළිබඳව අධ්‍යනය හොඳට තියෙනකොට – හිතක් පහළ වෙනවා කියනකොට – ඕකේ එහෙනම් කර්මයක් තියෙනවා කියල අපි දැන ගත යුතුයි. 'චේතනාවක් පහළ උනා' මේ විදියට කියනකොට එහෙනම් කර්මයක් පහළ උනා කියල අපි දැන ගත යුතුයි. මට කර්මයක් සිද්ධ උනා කියනකොට 'ආ ඔය චේතනාවේ වැඩ කැල්ලක් තමයි' කියල තේරුම්ගත යුතුයි. 'චේතනාවයි' 'කර්මයයි' කියන්නේ එකක් නිසා.

ඊළඟට උදාහරණයක් මේ පින්වතුන්ට පිහිට කරගැනීමට ඉදිරපත් කරා ආයතනයක manager වගේ කියල. ඒක ගත්තයින් පස්සේ manager තමයි කර්ම ප්‍රත්‍යය. Manager ගේ යටතේ වැඩ කරන්නාවූ ගෝල බාලයෝ සේවක සේවිකාවෝ සමූහය තමයි ප්‍රත්‍යය උපන්න ධර්ම - Manager ට ඒක හරියට චෛතසික ධර්ම වගේ. Manager ට පාලනය කරන්ට

ආයතනයක් තියෙනවනේ. ඒ ආයතනයේ ඔක්කොම දොර ජනෙල් වහන්නේ අරින්නේ පවා manager ට ඕනෑ විදියටයි. ඒක හරියට ආයතනයේ 'හිත' වගෙයි. ලොකු ආයතනයක් - manager ඒකෙ අස්සේ ඉන්නේ. හැබැයි වහලය තිබෙන්නේ - දොරවල් - ජනෙල් - වාහන - අරවමෙවා ඔක්කොම අනිත් මිනිස්සු වැඩ කරන්නේ එයාගේ පරිපාලනයට යටත්වයි. අනිත් ඔක්කොම එයාගේ යටතේ තියෙන ඒවා ප්‍රත්‍යය උපන්න. ඒ කියන්නේ එයාගේ managing power එක ලබන කට්ටියනේ. managing power එක ලබාගන්නාවූ කට්ටිය තමයි ගොඩනැගිලි ටිකයි - වාහන ටිකයි - සේවක සේවිකාවොයි ඔක්කොම ටික. ඒනිසා හිතක් පහළ වෙනකොට සිත සහ චෛතසික ධර්මත් ඊළඟට චිත්තජ රූපධර්මත් ඔය විධියට සහජාත චේතනාවේ ඒ බලය ලබන්නාවූ ක්‍රියාවට - මෙහෙයවන්නාවූ - බලය ලබන්නාවූ - ධර්ම කොට්ඨාසයෙයි කියල තේරුම් ගන්න කොට තරමක් දුරට මේ ධර්ම පිළිබඳව චිත්තජ රූපයක් හදා ගන්න පුළුවන් අවබෝධය සඳහා. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස භාවනා කරනකොට කයට සැහැල්ලුවක් දැනෙනවා. එතකොට ඒක ස්වාමීන්වහන්ස සහජාත කර්ම ප්‍රත්‍යයෙන් ඒ මොහෙතේ රූපයට දැනෙන එකක් කිව්වොත් ඒක හරිද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - එහෙම වෙනවා. එහෙම වෙනවා මහත්තයා අපි හැම එක්කෙනාගේම සිතේ ස්වභාවය ඇඟට ගහනවා. හොඳ හිතක් පහළ වෙනකොට හොඳ හිතේ ස්වභාවය ඇඟට ගහනවා. නරක හිතක් පහළ වෙන කොට නරක හිතේ සවභාවය ඇඟට ගහනවා. ඒක මම මේ කථා කරන වාක්‍යයෙන් අපිට නිකම් මේ සාමාන්‍යයෙන් එදිනෙදා ගොඩකරයෙන් පාවිච්චියට ගන්න පුළුවන් භාෂා වචනයක් තමයි මේ තේරුම් කර දීම පිණිස මේ හසුරුවන්නේ - කියල දෙන්නේ. හැබැයි ඒකෙ නියම ධර්මයමම කාරණයට ගියහම චිත්තජ රූපයි ඕවා. චිත්තජ රූපයි. හිත යම් ආකාරයක්ද ඒ ආකාරයට කය හැඩ ගැස්සෙනවා. කයට දැනෙනවා. අපිට - උපදවන උපදවන රූප පසු පස සිත්වලින් දැනෙනවා. ඒක මෙහෙම කියනවා නම් - තරහ සිත් ඇතිවෙනවා - තරහ සිත් ඇතිවෙන කොට ඒ තරහ සිතේ තිබෙන තරහවට - ගොරෝසුවට- ඒ කර්කශ ගතියට අනුකූලව ඒකෙ කලුපාට කර්කශ ඒ ඔක්කොම ටික ඔළුවේ ඉඳල දෙපතුල දක්වාම විහිදුවල පතුරුවල කර්කශ කරලා ගොරෝසු කරලා දාල තද කරලා හිර කරලා අප්‍රසන්න ගතියක් ඇතිකරනවා. ඒක කරන්නේ අර තරහ සිතෙන්. හැබැයි ඊට පසුපස සිත්වලින් අර ඉස්සෙල්ලා තරහ සිතින් හදාපු දේ පස්සේ පස්සේ සිත් වලින් ආයි ඊට පස්සේ කර්කෂ ගතිය ගොරෝසු ගතිය ආයේ යෙදෙනවා. එතකොට තමයි අපිට තේරෙන්නේ ඕක. ඒකනිසා හිතකින් හදල දෙන රූපමය ගුණ සවභාවය අපිට නැවත reflect වෙලා තේරෙනවා. දැන් ගිහි ජීවිතියක් ගත කරන අයනේ මේ - මේ ඔක්කෝම ගිහි ජීවිත ගතකරන අය. ගිහි ජීවිතිය කියල කියන්නේ කාම භෝගී ජීවිත. ඒ කාම භෝගී ජීවිත වල කාම සිත් අවශ්‍යයයි. කාම සිත් කියල කියන්නේ රාග සිත් ලෝභ සිත්. දැන් මේ රාග සිත් ලෝභ සිත් ගැන කවුරුවත් එහෙම කථා කරන්නේ නෑ. ඔය කොච්චර කාම සම්පත්තීන් වින්දත් ඕවා හරියට මතක් කරන්නේ නැතුව මාතෘකාව නැතුව පැත්තකට දාල අයින් කරලා ඊට පස්සේ නිකන් වෙන විදියකට තමයි සිතුවිලි ගන්නේ. හැබැයි බණ තේරුම් ගැනීමට නම් ලැජ්ජාවයි බයයි පැත්තකට විසිකරලා දාල ඕකට බහින්න ඕන. ඕකට බැස්සයින් පස්සේ

තේරෙනවා මහත්තයා දැන් අපි රාග සිතක් හැදුවම රාග සිතට අනුකූලව හදනවා - කාම සිතට අනුකූලව හදනවා - චිත්තජ රූපයක්. ඒ චිත්තජ රූපයේ තිබෙන්නාවූ - ඒ චිත්තජ මැවුමට අනුකූලව අපේ ශරීරය මෘදු කරනවා. අපේ ශරීරයට යම්කිසි සෞම්‍ය ගතියක් නිකං ලෙලවන පොළඹවන ඒවාගේම නලවන ගතියක් හදනවා. ඒ රූපමය නලවන ගතිය මෘදු කරන ඒවාගේම නිකං සනසවන ගතිය හැදෙන්නේ අර රාග සිතේ තිබෙන බලය හින්ද. ඒක චිත්තජ රූපයක්. පස්සේ ඇතිවෙන සිත්වලින් කරන්නේ මොකක්ද ඊට ඩිංගකට කලින් රාග සිතකින් කාම සිතකින් ලෝභ සිතකින් හදල ඇඟ හැම තැනම පතුරුවලා විසුරුවලා කුඩු ගහල තියෙන්නා වගේ හදල දෙන්නාවූ රූපයේ තිබෙන සෞම්‍යය ගතිය ලෙලවන නලවන පිනවන ගතිය පස්සේ පස්සේ සිත් වලින් විඳ විඳ යනවා. ඒකනිසා එක වෙලාවකට සිත් කරන්නේ කාමුක රාග මනෝමය පින්තූර විඳිනවා. ආයේ ටික වෙලාවකින් ඒ පින්තූරෙන් හදල දීපු ඇඟේ පැතිරිලා තිබෙන්නාවූ රූප ටික විඳිනවා. ආයෙත් යනවා මනෝමය චිත්ත රූපයකට ගිහිල්ලා ඒක විඳිනව - ආයේ ඇඟේ හදල දෙන්නාවූ ලෝභමය චිත්තජ රූප ටික විඳිනව. ඔය රාග සිත්වල මිනුස්සු සමවැදුන වගේ ඔය ජොබ් එක කරගෙන යන්නේ - ඔකේ තමයි ඉන්නේ. ඒකනිසා වෙන එව්වා යන්නේ නෑ. සිහිය නුවණ දාපු ගමන් ටක් ගාලා අහුවෙනවා හොඳට මේ යන්නේ අර channel එකෙන් ආපු ඒවා මේ යන්නේ මේ රූප ටික මේ channel එකෙන් ආපු එව්වා මේ රූප මේ channel එකෙන් ආපු ඒවා කියල. අනිත් එක තමයි තරහ සිතේ තද ස්වභාවයට අනුකූලව හදන රූප තදයි. රාග සිතේ කාම සිතේ බලවත් කමට අනුකූලව ඇඟේ හදන්නාවූ රූපවල රහ ගුණෙත් වැඩියි. ඔකේ අල්ලන්න අමාරු ගතිය තියෙන්නේ මෝහ සිතේ. රාග සිතෙයි ද්වේශ සිතෙයි දෙක තේරුම් ගන්න ලේසියි. ඒක නිසා අපි භාවනාවකට යනකොට ඔන්න ඔය පිළිබඳව පොඩ්ඩක් අතපත ගැහුවොත් යෝනිසෝමනසිකාරයෙන් ධර්‍මය තේරුම් ගන්ට හරිම රුකුලක් වෙනවා. හරි පහසුවක් වෙනවා. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අවසරයි එතකොට දැන් මේ ලෝකයේ පවතින්නේ ශක්තින් පමණයි නම් පුද්ගලයෝ නෑ කියල හිතුවනම් එතකොට මේ චිත්ත චෛතසි ධර්‍ම වලට තමයි අපි ශක්තිය කියල කියන්නේ. එතකොට මේ ශක්තිය තමයි කර්මය වන්නේ කියල තමයි මම අවබෝධ කරගත්තේ. එතකොට මේ වේදනාව අනුව අපි හදාගන්නවා අපේ කර්ම. ඒක තමයි ශක්තිය කියල හඳුන්වන එක නිවැරදිද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒකෙ පොඩි repair කරන්න ඩිංගක් තියෙනවා කියල තමයි මට හිතෙන්නේ. ඔය ඉස්සෙල්ලා කියපු එක හරි. ඒ කියන්නේ මේ ලෝකය කියල කියන්නේ සත්වයෙක් පුද්ගලයෙක් නැති චිත්ත චෛතසික ශක්ති සමූහයක් තමයි. ඒක හරි. හැබැයි ඒ චිත්ත චෛතසික ශක්ති සමූහය ගුණ ස්වභාවය ඒ වේග ස්වභාවයන් එක සමාන වෙන්නේ නෑ. ඒවා එකින් එකට එකින් එකට වෙනස්. චිත්තයේ තිබෙන ශක්තිය වෙනස් - වේදනාව කියන එකේ ශක්තිය ගුණය වෙනස් - ස්පර්ශයේ ශක්තිය ගුණය වෙනස් - මනසිකාරයේ ශක්තිය ගුණය - චේතනාවේ ශක්තිය ගුණය වෙනස්. ඒකනිසා අමුතුම විදිහේ වෙනස් වෙනස් වෙනස් ශක්ති - බල තිබෙන්නා - ගුණ සමූහය අතර තිබෙනවා එකම එක බල ධර්‍මයක්. එහෙම නැත්නම් ආවේග ගුණ ධර්‍මයක්. ඒකට පුළුවන් කම තියෙනවා අනිත් ශක්තියකට අතිරේක වැඩක් කරන්න. ඒ වැඩේ තමයි කර්මය එක්කාසු කිරීමේ වැඩේ. ඒක චේතනාවට විතරයි තියෙන්නේ. අනිත් ඒවාට නෑ. හැබැයි චේතනාව කියන ඒ කර්ම එක්කාසු කරන ඒ

ශක්තිය කර්ම එකතු කිරීමේදී එයා ළඟින් ඉන්න වට පිටාවේ ඉන්නාවූ අනිත් අයගේ උදව් උපකාර ලබාගන්නා එක තියෙනවා. ඒක වෙන එකක්. ඒකනිසා එහෙම හිතා ගන්න එක හරි කියල මෛත්‍රියෙන් සිහිපත් කරනවා. තෙරුවන් සරණයි!

බොහොම පින් ස්වාමීන්වහන්ස

ස්වාමීන්වහන්ස අර ඉස්සෙල්ල වේදනාව සම්බන්ධයෙන් කියපු දේශනය ගැන - අපි දැන් කැමති රූපයක් දැකල කලින් ඒක ගැන මනසින් සතුටුවෙන කොට කයෙහි රූප හැදෙනවා ඒනිසා තවත් සැහැල්ලු ගතියක් සහ තවත් විඳීමක් වගේ දෙයක් ඇතිවෙනවා - නැවතත් ඒ රූපය බලන්ට අපිට යන්න ඕන කම ඇතිවෙන්නේ ඇත්තටම අර ඒ දැනිච්ච වේදනාව නිසාද කියල හිතෙනවා ස්වාමීන්වහන්ස. එහෙම හිතුවොත් නිවැරදිද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක හරි මහත්තය මෙහෙමයි - දැන් ඔය වේදනාව කියන එකට අපි හරියට ලෝභ කරනවා. ඔය ඇතිවෙන්නාවූ ඕකේ තියන වින්දනීය ස්වභාවයට ( වින්දනීය ස්වභාව දෙකක් තියෙනවා ඔතන වෙන් කරලා ගන්න ) එකක් තමයි මනෝමය රූපය විඳවනවා. අනිත් එක මනෝමය රූපයත් එක්ක ඇඟේ පතුරුවෙලා තියෙන රූපමය සැහැල්ලු වින්දනය ඇඟෙන් විඳිනව. එතකොට එකක් මනසෙන් හදල දෙන මනෝමය චිත්තජ රූපය. ඊට පස්සේ අනිත් එක ඇඟේ පතුරුවලා දෙන්නාවූ කායික රූප ස්වභාවය. අර මනෝමය පින්තූරය විඳින එකට කියනවා සෝමනස්ස ස්වභාවය කියල. ඇඟේ ඇතිවෙන්නාවූ එකට කියනවා සුඛ ස්වභාවය කියල. එතකොට මනස සුඛ ස්වභාවයයි සෝමනස්ස ස්වභාවයයි වරින් වර එහෙට මෙහෙට වෙනස් කර කර විඳ විඳ ඉන්නවා. ඕක සමහර වෙලාවට ටික වෙලාවක් යනකොට අඩුවෙනවා . ඒ කියන්නේ අපි හිතමු ටිකක් ප්‍රායෝගිකව බලන්න. ටික වෙලාවක් ඕක හිත හිතා ඉන්නකොට එපා වෙනවා. එපා උනාට පස්සේ ආරම්මණය අමතක වෙලා යනවා හරි ආරම්මණයෙන් හිත නිකං ඒකෙන් අයින් වෙලා වෙන එහෙකට යනවා. එහෙම ගියාම - අපි හිතමු දැන් අර රාග සිතත් නෑ. රාග මනෝමය පින්තූරෙත් නෑ. පස්සේ ඩිංගක් වෙලා ගියහම පස්සේ සිතකට මතක් වෙනවා අර ඉස්සෙල්ලා පින්තූරේ ගහගෙන ඉන්න වෙලාවේදී දැනිච්ච සුඛ වේදනාවයි සෝමනස්ස වේදනාවයි. ඒක මතක් වෙච්ච ගමන් ඊට පස්සේ මොකද කරන්නේ ආයිත් අර රූපය පින්තූර ගතකර ගන්නවා නැවත ගිහිල්ලා ඒක on කරගන්නවා තමන්ගේ හිතට. ඇයි එහෙම ගියේ? පස්සේ ඒ හිත අර නැතිවෙලා මැකිලා යන්න ගිය චිත්ත රූපය යන්ට අරින්නේ නැතුව ආපහු ආපහු ඒක on කරව ගත්තේ ඇයි? මතක් කරලා ඒ රූපයට ඒ මානසික ස්වභාවයට ගියේ - ඉසෙල්ලා එපා වෙලානේ ආවේ. හැබැයි එපා වෙලා ආවට ඒ වෙලාවේ ආයේ ඒකෙන් ඇතිකරලා මතුකරලා දෙන්නාවූ අර වේදනාව තියෙනවනේ - සුඛය - ඒක මතක්වෙන කොට ආපහු එතෙනට යනවා. ආපහු එතෙන්ට ගිහිල්ල ආපහු අර reel එක දාල විඳින්ට යනවා. හැමවෙලාවෙම චිත්ත රූප හදා ගන්නවා ඒකට අනුකූලව ඇඟ හැදෙනවා. ඊට පස්සේ පින්තූරේ මනසෙන් බලනවා සැප විඳිනව. ඒකෙන් හදල දෙන්නාවූ රූපමය ගුණය ආයේ කයින් විඳිනව. ඕක මතක නැතිවෙලා යනකොට ආයිත් එතෙන්ට යනවා. ඒකනිසා තමයි කියන්නේ. **'වේදනා පච්චයා තණ්හා'** - වේදනාව නිසයි ඒ පැත්තට හැරෙන්නේ. අර වේදනාව මතක් වෙනකොට අතහැරලා දැම්මත් කමක් නෑ - ආයිත් එතෙන්ට යනවා. ආයිත් එතෙනට යනවා. ඒක තමයි තියෙන්නේ.

බොහොම පින් ස්වාමීන්වහන්ස අප්‍රමාණ පින් එතකොට අපි ඒ ක්‍රියාවලිය ගත්තත් එතෙන්දි සහජාත කර්ම ප්‍රත්‍යය මේ ආකාරයෙන් වේදනාවටත් අනිකුත් චෛතසිකයන්ටත් උදව් කරන විදියක් - අද සාකච්ඡා කරපු දේවල් තුලින් අපිට අර රූප ඇති වෙන විදියත් සහජාත කර්ම ප්‍රත්‍යයයෙන්ම ඒ රූප ඇතිවෙන විදියත් යම්කිසි විදියකට තේරුනා ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි අවසරයි අපේ හාමුදුරුවනේ කර්ම ප්‍රත්‍යය විස්තර කරත්දී චේතනාව ඔබ වහන්සේ සඳහන් කළා බොහොම පැහැදිලිව දෙයාකාරයකට තියෙනවා. එකක් තමයි ක්‍රියා සිතක මට්ටමෙන් රහතන්වහන්සේට වගේ චේතනාව හට ගත්තහම අනාගත කර්මයක් සඳහා දෙයක් සකස් වෙන්නේ නෑ. එතනින් මෙහා කෙනෙකුට අනාගත කර්මයක් සඳහා ඒක ප්‍රත්‍යය වෙනවා. එතකොට ඒක 'කම්ම පච්චයෝ' කියන කොට තේරුම් ගන්න පුළුවන්. ඒවගේම දැන් අපි චේතනාව සහජාත ප්‍රත්‍යය හටගන්නවා වගේම දැන් එතන අනාගත කර්මයකට ප්‍රත්‍යය වෙනවා කියනකොට එතකොට අනාගත දේට මේක ප්‍රත්‍යය වෙලා තියෙනවා. ඒවගේ අපිට ඔකේ අනිත් පැත්ත ගත්තොත් දැන් මේ මොහොතේ චේතනාවට අතීත කර්මයක් ප්‍රත්‍යය වීම 'කම්ම පච්ච්චයෝ' කියල කථා කරන්න පුලුවන්ද? තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එහෙම කථා කරන්ටනම් අවශ්‍ය යයි. ඒක මම අපේ පින්වතුනට පැටලුම් සහගත වෙයි කියල මම ඒක දෙකට කැඩුව. දෙකට කඩල කොටසක් බෑග් එකේ ඉතුරු කරගත්ත ලබන සතියට සහජාත චේතනා සම්බන්ධයෙන් මම ඇත්ත වශයෙන් ගොඩක් කිව්වා. අතන තියෙනවා එකක් - මහත්තය අහපු ප්‍රශ්නයට එකක් විතරක් කියන්න පුළුවන්. එකක් තමයි රහතන්වහන්සේලාගේ හිත් වල සහජාත කර්ම ප්‍රත්‍යය විතරයි තියෙන්නේ. සාමාන්‍ය කෙනෙකුගේ හිතක - එක වෙලාවේ සහජාත කර්ම ප්‍රත්‍යයයි නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යයයි කියන දෙකම සිද්ධ වෙනවා. ලබන සතිය වෙනකම් මේ ඩිංග ඇතෙයි කියල තමයි මගේනම් අදහස. හැබැයි වටිනා ප්‍රශ්නයක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් පටිච්චසමුප්පාදය කියන එක ස්වාමීන්වහන්ස දැන් රහතන්වහන්සේ ගත්තම අවිද්‍යාව පහ කරලනේ. එතකොට අවිද්‍යාව නැති හින්ද සංඛාර නෑ කියල ඒ විදියට විස්තර කරගෙන යනවනේ ස්වාමීන්වහන්ස. ඒ උනාට ස්වාමීන්වහන්ස ජීවත්වෙලා ඉන්නතාක් කල් රහතන්වහන්සේගේත් යම් පටිච්චසමුප්පාදය ක්‍රියාවක් වෙනවද ස්වාමීන්වහන්ස ඒක කොහොමද විස්තර කරගන්නේ?

<u>පිළිතුර</u> - ඇත්ත වශයෙන්ම ඔය පටිච්චසමුප්පාදය කියාගෙන යනකොට ඔය පටිච්චසමුප්පාදය යම්කිසි තැනක - හේතුවක් නිසා දෙයක් හටගන්නා ගතිය තියෙනවානම් පටිච්චසමුප්පාදය ඔකේ තියෙනවා. දැන් ඔය මහත්තය කියපු එකේ මට තේරෙන්නනේ - දැන් අපි සාමාන්‍යයෙන් මහත්තය පටිච්චසමුප්පාදය කියල තෝරාගෙන හිතාගෙන ඉන්නේ අර මහා නිධාන සූත්‍රයේත් සංයුක්ත නිකායේ සූත්‍රවලත් කියල තියෙන 'අවිද්‍යා පච්චයා සංඛාර' කියන එකෙන් පටන් ගත්ත එක තමයි අපි ගොඩක්ම පටිච්චසමුප්පාදය හැටියට අරන් තියෙන්නේ. ඒකෙ තියෙනවා පටිච්චසමුප්පාදය සලකා බැලීමේදී එක සිතක පටිච්ච අංග බැලීම - දැන් අපි මේ වෙලාවේදී මේ බණ අහනවා - එතන පටිච්චසමුප්පාදය

ක්‍රියාවලියක් නේ සිද්ධ වෙන්නේ. දැන් ඕක රහතන්වහන්සේ අවබෝධ කරගත්ත. හැබැයි රහතන්වහන්සේ අවබෝධ කරගත්ත ධර්මය උන්වහන්සේගේ - දැන් බලන්නකෝ - රහතන්වහන්සේ නමක් බලනවා පිණ්ඩපාතයේ ගිහිල්ල ගෙදර දායක මහත්තය කථා කරනවා 'ඇතුලට වඩින්න' නැත්නම් 'ස්වාමින්වහන්ස දානය බාර ගන්න' කියල. ඉතින් ඒ වෙලාවේදී උන්වහන්සේට තිබෙන්නේ ක්‍රියා සිත්නේ තියෙන්නේ ඒවා අව්‍යාකෘතයිනේ - ඒ අව්‍යාකෘත ධර්මයට අනුකූලව ඒ වෙලාවට ක්‍රියා මාත්‍රා සිද්ධ වෙනවනේ පටිච්චසමුප්පාදයට අනුකූලව. අවිද්‍යා පච්චයා නැති උනාට එතැනදී. ඒක නිසා ඕකට මහත්තය කියනවා - විභංගයේ තිබෙනවා 'පටිච්චසමුප්පාද විභංගය' කියල වෙනම ටිකක්. ඒකෙ කියන්නේ එක සිතක් ගත්තම ඒ හිතේ අංග උපාංග කොච්චරක් තිබෙනවද? පටිච්චසමුප්පාද අංග. ආන්න එතන කථාකරන කොට හොඳට පැහැදිලි වෙනවා රහතන්වහන්සේගේ ජීවිතියේ - හේතු ඵල ධර්ම අවිද්‍යාව නැති කලාට එතන චක්ඛු ප්‍රසාදය සෝත ප්‍රසාදය ඒවා පහළ වෙන තාලේ - චේතනාවල් පහළ වෙන තාලේ - චෛතසික ධර්ම ක්‍රියාත්මක වෙන තාලේ. ඒවා අව්‍යාකෘත ධර්ම. නමුත් පටිච්චසමුප්පාදය රංචුවේ වැඩ කරන තාලේ හොඳට තියෙනවා. ඕක වෙන්නේ මහත්තය අපි පටිච්චසමුප්පාදය කියල හසුරුවාගෙන තියෙන්නේම අර **'වේදනා පච්චයා තණ්හා - තණ්හා පච්චයා උපාදාන** … අපිට අමතක වෙනවා **විඤ්ඤාණ පච්චයා නාමරූප - නාමරූප පච්චයා සළායතන - සළායතන පච්චයා ඵස්ස** - ඔය විදියට ඒ ටික ටිකක් අපිට skip වෙනවා ඒ නිසා **'ඵස්ස පච්චයා වේදනා'** - දැන් රහතන්වහන්සේට යම්කිසි හොඳ ආහාරයක් දැක්කට පස්සේ හොඳ තැනක් දැක්කට පස්සේ ප්‍රසන්න හිතක් පහළ වෙනවා. අපි හිතමු මෙහෙම. රහතන්වහන්සේ නමක් පළවෙනි ධ්‍යානයට සමවදිනවා. ආනන්ද හාමුදුරුවෝ ගොඩක් ප්‍රශංසා කරලා තියෙන්නේ සැරියුත් ස්වාමීන්වහන්සේට - සැරියුත් ස්වාමීන්වහන්සේ දානේ වළඳලා ගිහිල්ලා ප්‍රථම ධ්‍යාන සමාපත්තියට සමවදිනවා. ඉතින් සමවැදිලා ඉවරවෙනවා - ප්‍රථම ධ්‍යාන සමාපත්තියේ තියෙන්නේ මොනවාද? ඵස්ස වේදනා සංඥා චේතනා ඒකග්‍රතා ජීවිතේන්ද්‍රිය මනසිකාර විතර්ක විචාර අධිමොක්ඛ විරිය ප්‍රීති චන්ද. ඔය ටික තියෙනවා ඊට පස්සේ කුසල චෛතසික ධර්ම සමුදායක් තියෙනවා ප්‍රඥාවත් එක්ක. එතකොට තියෙන්නේ එතන ස්වාමීන්වහන්සේ හිතේ පහළ වෙන්නේ අපි හිතමු අනාපන සතිය ගත්තොත් එහෙම උන්වහන්සේ අනාපාන සති ධ්‍යානයේ ඉන්නතාක්ම ආරම්මණය ඇවිල්ල රූපයයි. ඒ තමයි ආශ්වාස ප්‍රාශ්වාස. ඊට පස්සේ භාවනාවේ උන්වහසේට ධ්‍යානය ලබා දීපු මනෝමය ධර්මය. සැරියුත් ස්වාමීන්වහන්සේගේ හිතේ ඒ වෙලාවේදී පහළ වෙනවා චෛතසික ධර්ම 33 ක් සමග සිත - නාම ධර්ම තියෙනවා 34 ක්. ඒ නාම ධර්ම 34 රේ පටිච්චසමුප්පාදය තියෙනවා. **'අවිද්‍යා පච්චයා'** තමයි නැත්තේ. ඕක අව්‍යාකෘත ධර්මයක්. ඒ කියන්නේ රහතන්වහන්සේ ඒ වෙලාවේදී කෙලෙස් උපදවන්නේ නෑ - කුසල් සිද්ධ වෙන්නෙත් නෑ - අකුසල් සිද්ධ වෙන්නෙත් නෑ. දැන් අකුසල් සිතක පටිච්චසමුප්පාදය කුසල් සිතක පටිච්චසමුප්පාදය ක්‍රියා සිතක පටිච්චසමුප්පාදය - ඔය සිත් 89 යේම මහත්තය පටිච්ච ගුණ සලකා බලන විදියක් තියෙනවා. හැබැයි ලෝකෝත්තර ඒවගේ තමයි එහෙම එකක් නැත්තේ. අනිත් ඒවා ඔක්කොගේම තියෙනවා.

අප්‍රමාණ පින් ස්වාමීන්වහන්ස මම පොඩ්ඩක් කියවල තේරුම් ගන්න බලුවා . ඒක පොඩ්ඩක් ගැඹුරුයි. අනාගතේ දවසක ඔබවහන්සේට ඒගැනත් අපිට උදව්වක් කරන්න ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. ඔබ වහන්සේ කිව්වා වගේම මම දැනට තේරුම් අරගෙන හිටිය එකත් එක්ක ඔබ වහන්සේ කියපු විස්තරය ගටුමක් නෑ. හැබැයි ඔබ වහන්සේ කිව්ව පරිදිම

ස්වාමීන්වහන්ස මේ දවස්වල ඇහෙන කොට ඒ පටිච්චසමුප්පාදය  රහතන්වන්සේගේ සිතට ඒ වෙන දේ අමතක කරන හින්ද ස්වාමීන්වහන්ස දහම් කරුණු වෙන පැත්තකට යනවා වගේ ගතියකුත් තියෙනව ස්වාමීන්වහන්ස. ඒකනිසා ඔබ වහන්සේ මේ පැත්තත් යන්තම් හෝ විස්තර කරන්න පුළුවන් නම් ලොකු උපකාරයක්. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි මහත්තය ධර්ම පිපාසය තිබෙනවානම් මහන්සියක් නැතුව ඉතින් ඔය බුදුරජාණන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් මොනවා හරි කියල දෙන්න පුළුවන්. හොඳයි මතක් කරපු එක. ඉදිරියේදී අපි අවස්ථාව සලසා ගනිමු. තෙරුවන්  සරණයි!

හොඳයි ස්වාමීන්වහන්සේගේ කාලවේලාව අනුව වැඩ සටහන නිමා කරන්න පුළුවන්. එහෙමනම් ස්වාමීන්වහන්ස අදත් මේ අයුරුන් අනුග්‍රය කිරීම පිළිබඳ -ඔබවහන්සේගේ කාලවෙලාව සලකන කොට අපිට යම්කිසි සංවේගයකුත් ඇතිවෙනවා මධ්‍යම රාත්‍රිය දක්වාම අප හා රැඳී ඉඳල මේ ධර්මය අපිට පැහැදිලි කරලා දෙන්න ඔබ වහන්සේ කොච්චර උත්සාහයක් ගන්නවද - කොච්චර කැප කිරීමකින් යුතුව ඒ දේ කරනවද කියල ස්වාමීන්වහන්ස ඉතින් ඔබ වහන්සේගේ පාද නමස්කාර කර අපි මේ සාකච්ඡාවේදී ජනිත කරගත්තාවූ සියලු කුසල ධර්මයනුත් අප විසින් මේ තාක් කරනලද සියලු කුසල ධර්මයනුත් ඔබවහන්සේට අනුමෝදන් කර සිටිනවා ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට වහ වහාම පූර්ණ වශයෙන් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ වේවා කියල අපි සවනට සිසිලස වෙනුවෙන් ප්‍රාර්ථනා කරනවා ස්වාමීන්වහන්ස.  ඔබ වහන්සේට යොමු වෙන්නම් අද දවසේ සාකච්ඡාව නිමා කරන්ට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි. සැමදෙනාටම තෙරුවන් සරණයි! මේ අපේ පින්වත් මහත්මයලා මහත්මීන් එකතුවෙලා කල්‍යාණමිත්‍ර අපේ දළුවත්ත මහත්මයා විසින් මෙහෙය වන ලද සහ ඉදිරිපත් කරන ලද ඒ ධර්ම මණ්ඩපයෙන් නියම දහම් ප්‍රතිපල ලබා ගන්ට අවස්ථාවක් සලසා ගත්ත. ධර්මය ඇහුවා සාකච්ඡා කළා නොසිතන පැතිවල ධර්ම ප්‍රදේශවල මානසික වශයෙන් ඒවාගේම යෝනිසෝ මනසිකාරය පැවැත්වීම වශයෙන් ගමන් කලා. ඉතින් අපි සැම දෙනාටම තව තවත් මේ වාගේ ධර්මයෙන් ඉස්සරහට සියුම් තැන ස්පර්ශ කරමින් - සියුම් තැන් හොය හොයා ඒවා අවබෝධ කරගනිමින් ඉස්සරහට යා ගන්ට ලැබේවා කියල අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. උපදවාගත්තා වූ බණ ඇසීමේ පිං - බණ දෙසීමේ පිං - සාකච්ඡා කිරීමේ පිං බලයෙන් පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාට නිදුක් නිරෝගී දීර්ඝායු ශ්‍රී සම්පත් ලැබේවා! එතුමාට මේ කරන ධර්ම සේවාව නිසා වහ වහාම චතුරාර්ය සත්‍යයන් ගාම්භීර ධර්මයන් අවබෝධ කරගන්ට ලැබේවා! ඒවාගේම මේ සැම දෙනාටමත් සැනසිල්ලක් යහපතක් වේවා! සැම දෙනාටම සුවසේ නිවන් ගමන යාගන්ට ලැබේවා! අපේ මේ පින්වත් ප්‍රශ්න ඇසූ මහත්මයා ඊළඟට මෙහෙයවපු අපේ ජයන්ත මහත්මයා මහත්මීන් ඇතුළු ප්‍රශ්න ඇසූ සැම දෙනාටමත් අසාගෙන සිටි සියලුදෙනාටමත් පසු අවස්ථාවකදී මේවා අහන්නා වූ කියන්නාවූ සිතන්නාවූ සැම දෙනාටමත් මේ පින් බලයෙන් සහ තුරුණුවන් සතු අනන්ත අපරිමාණ ගුණ බලයෙන් ඉතාමත්ම හොඳින් ගාම්භිර වූ ධර්ම තව තව අහමින් - පටලැවුනු තැන් නිරවුල් කරගනිමින් - ඒවාගේම ධර්මය හොඳට යහපත් ලෙස පෙළ ගස්සාගෙන අවබෝධ කරගෙන බුද්ධාදී උතමයන් වහන්සේලා අවබෝධ කර

ගත්ත සදාකාලික සැප ඇති කිසිම අවුලක් නැති හේතුවක් ඵලයක් විස්වාස කරන්නේ නැති නාම ධර්මයක් මොකක්වත් නැති අව්‍යාකෘත වූ ප්‍රනීත වූ ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ලැබේවා! නිවන් පිණිස මේ කුසල් හේතු වාසනා වේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.